# විගණකාධිපති දෙපාර්තමේන්තුව

**සී/ස ලංකා සතොස විසින් 2014 සහ 2015 වර්ෂවලදී සිදු කරන ලද**

**සහල් ආනයන ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2016 සැප්තැම්බර් 20 දින පැවති**

**පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි**

**විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන**

**විශේෂ විගණන වාර්තාව**

# පටුන

**පරිච්ඡේදය** **පිටුව**

1. උක්ත වාර්තාව නිකුත් කිරීමේ පසුබිම සහ වාර්තාවේ ස්වභාවය ………………………….. 7

2. මෙම වාර්තාව පිළියෙල කිරීමේදී අනුගමනය කල පියවරයන්

2.1 ලේඛන පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම ………………………………………… 7

2.2 වෙනත් පරීක්ෂාවන් ……………………………………………………………….. 8

3. විෂයය පථය සීමාවීම …………………………………………………………………... 9

4. පොදු කරුණු

4.1 සමාගම සංස්ථාපනය කිරීම ……………………………………………………… 11

4.2 සමාගමේ අරමුණු ……………………………………………………………... 11

4.3 අධ්‍යක්ෂක මණ්ඩලය සංයුතිය ………………………………………………………… 12

4.4 කාර්යය මණ්ඩල තොරතුරු ……………………………………………………… 14

4.5 ලංකාවේ වී නිෂ්පාදනය, දේශීය හා ආනයනික සහල් සැපයුම සහ සහල් පරිභෝජනය .. 14

4.6 2012 සිට 2015 වර්ෂය දක්වා පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය විසින් සිදුකල සහල් ආනයනය පිළිබඳ තොරතුරු ……………………………………………………... 15

4.7 ලංකා සතොස ආයතනය විසින් සහල් මිලදී ගෙන තිබූ ආකාරය …………………... 16

4.8 ලංකා සතොස ආයතනයේ මාසික ආනයනික සහල් අලෙවිය ………………………... 16

4.9 ලංකා සතොස ආයතනය සතුව පැවති සහල් තොග ප්‍රමාණයන් …………………… 17

5. ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවල සහල් ආනයන කිරීම පිළිබඳ සිදු කල පරීක්ෂාව ……………………………………………………………………….. 19

5.1 දේශීය වෙළඳපොළෙන් ආනයනික සහල් මෙ.ටො. 18,134 ක් මිලට ගැනීම ………… 20

5.2 පසු ගෙවුම් ක්‍රමය (Document Against Payment) යටතේ සහල් මෙ.ටො. 29,262 ක් ආනයනය කිරීම ………………………………………………………………… 21

5.3 2014 ජූලි 31 දිනැති අංක 14/0940/540/005 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය ………………………………………………….. 22

5.4 අංක 42002140026193 දරන ණයවර ලිපිය මඟින් නාඩු සහල් මෙ.ටො. 1,040 ක් ආනයනය කිරීම. ……………………………………………………………....... 26

අංක BTD – M63519 සහ අංක BTD – M63537 දරන ණයවර ලිපි මඟින් සහල් මෙ.ටො. 90,901ක් ආනයනය කර තිබීම ……………………………………… 27

5.5 අංක 42002140033274 සහ 42002140033283 දරන ණයවර ලිපි මඟින් සහල් මෙ.ටො. 61,354 ක් ආනයනය කිරීම …………………………………………… 36

5.6 රජයකින් රජයකට ලබාදෙන පදනම මත බංගලාදේශ රජයෙන් නාඩු සහල් මෙ.ටො. 25,000 ක් ආනයනය කිරීම ………………………………………..……… 38

6. ආනයනික සහල් ඉතිරි තොගය ………………………………………..……… 40

7. ආනයනික සහල් සඳහා දරන ලද මුළු පිරිවැය ……………………………………… 42

8. ආනයනික සහල් අලෙවියෙන් ලැබූ මුළු ආදායම …………………………..……… 45

9. සහල් ආනයනය කිරීම නිසා රු.15,157,031,018 ක අලාභයක් ලංකා සතොස ආයතනයට/ රජයට සිදු වී තිබීම …………………………………………………………………... 47

10. සහල් ආනයනය සඳහා අරමුදල් සපයා ගැනීම ………………………………………... 48

11. ආනයනික සහල් සඳහා අතිරේක ගබඩා පහසුකම් ලබා ගැනීමට සිදු වීම ………………… 49

12. පොදු නිරීක්ෂණ ……………………………………………………………………... 53

13. පද්ධති හා පාලන …………………………………………………………………… 55

14. නිර්දේශ …………………………………………………………………………. 56

15. නිගමන …………………………………………………………………………... 58

# සීමාසහිත ලංකා සතොස (ලංකා සතොස) විසින් 2014 සහ 2015 වර්ෂවල සහල් ආනයනය කිරීම් පිළිබඳව ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව

---

## උක්ත වාර්තාව නිකුත් කිරීමේ පසුබිම සහ වාර්තාවේ ස්වභාවය

සමූපකාර තොග වෙළඳ සංස්ථාව සහ ලංකා සතොස ආයතන සම්බන්ධයෙන් 2016 සැප්තැම්බර් 20 දින පැය 1430 ට පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලංකා සතොස විසින් 2014 සහ 2015 වර්ෂවල ආනයනය කළ සහල් පිළිබඳව පරීක්ෂා කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විගණකාධිපති වෙත කරන ලද ඉල්ලීම පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. (ඇමුණුම 01)

## 2. මෙම වාර්තාව පිළියෙල කිරීමේදී අනුගමනය කළ විගණන ක්‍රමවේදයන්

පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී.

### 2.1 ලේඛන, පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම

(අ) ලංකා සතොස ආයතනයේ ගබඩා තුළ ඇති සහල් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2015 ඔක්තෝබර් 16 දින පත් කරන ලද පංච පුද්ගල කමිටු වාර්තාව;

(ආ) ලංකා සතොස ආයතනයේ ආනයනික සහල් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ලංකා සතොස සභාපති විසින් 2015 ඔක්තෝබර් 19 දින පත් කරන ලද කමිටු වාර්තාව;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවල ඇතුළත් ශ්‍රී ලංකාව තුළ වාර්ෂික වී සහ සහල් නිෂ්පාදනය පිළිබඳ දත්ත;

(ඈ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයෙන් ලබාගත් ශ්‍රී ලංකාවේ සහල් අවශ්‍යතාවය, වාර්ෂික නිෂ්පාදනය සහ සහල් ආනයන පිළිබඳ දත්ත;

(ඉ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලබාගත් තොරතුරු;

(ඊ) මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවලින් ලබාගත් තොරතුරු;

(උ) ලංකා සතොස ආයතනයෙන් ලබාගත් තොරතුරු, දත්ත සහ සහල් ආනයනයට අදාල ලිපිගොනු;

(ඌ) ආනයනික සහල් ගබඩා මුද්‍රා තැබීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් ලබාගත් තොරතුරු;

(එ) ශ්‍රී ලංකා රේගුවෙන් ලබාගත් 2012, 2013, 2014 සහ 2015 වර්ෂවල සහල් ආනයනය කිරීම පිළිබඳ තොරතුරු සහ දත්ත;

(ඒ) වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් තොරතුරු;

(ඔ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු;

(ඕ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ගබඩා කුලී පිළිබඳ තොරතුරු;

(ක) ලංකා බැංකුව සහ මහජන බැංකුවෙන් ලබා ගත් ණය පිළිබඳ තොරතුරු.

## 2.2 වෙනත් පරීක්ෂාවන්

(අ) ආනයනික සහල් ගබඩා කර තිබූ මීතොටමුල්ල, වේයන්ගොඩ, මැකලම් සහ ඒකල ගබඩාවල සිදු කළ භෞතික පරීක්ෂාව.

(ආ) ACE බහාළුම් අංගනයේ කුලී පදනම මත රඳවා තබා තිබුණු බහාළුම් තුල අඩංගු සහල් පිළිබඳ භෞතිකව පරීක්ෂාව.

(ඇ) ලංකා සතොස ආයතනයේ නිලධාරින්ගෙන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්ගෙන් ලබා ගත් ලිඛිත ප්‍රකාශ.

## 3. විෂය පථය සීමාවීම

මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේදී මාගේ විෂය පථය මතු දැක්වෙන සීමා කිරීම්වලට යටත්ව තිබූ බව අවධාරණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයෙන් විගණකාධිපතිවරයාට රාජ්‍ය සමාගම් සම්බන්ධ විගණනය කිරීම සඳහා බලතල ලැබෙන තෙක්, ලංකා සතොස ආයතනයේ ඍජු විගණනයක් සිදු කිරීමට නොහැකි වීම / අවස්ථාවක් නොලැබීම.

(ආ) 2014 වර්ෂයේ සිට සිදු වූ මෙම විෂයයගත ක්‍රියාවලිය සහ ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය විගණකාධිපති වෙත පැවරුණු දිනය අතර වර්ෂ 2 ක පමණ කාල පරතරයක් තිබීම.

(ඇ) සහල් තොග පරීක්ෂා කිරීම සඳහා පැවති බාධාවන්

- (i) ලංකා සතොස ආයතනය විසින් සහල් තොග පිළිබඳව භෞතික තොග ආගණනයක් සිදු කර නොතිබීම.
- (ii) සහල් ගබඩාවල විධිමත් තොග ලේඛන පවත්වාගෙන නොයාම.
- (iii) භෞතිකව පරීක්ෂා කළ හැකි වන පරිදි / ගණනය කළ හැකි වන පරිදි ගබඩාවල පැවති සහල් තොග ගබඩා කර නොතිබීම.
- (iv) මීතොටමුල්ල, වේයන්ගොඩ, මැකලම් සහ ඒකල ගබඩා පරීක්ෂා කරන අවස්ථාව වන විට පැවති සහල් තොගවලින් බොහොමයක් පරීක්ෂා කළ නොහැකි පරිදි හානි වී තිබීම.
- (v) එක් එක් ගබඩාවල සහ ආයතනයේ පවතින තොග පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වන පරිදි ලේඛනගත / පරිගණකගත කරන ලද විධිමත් ක්‍රමවේදයක් නොතිබීම.

(ඈ) ඇමුණුම් 02 හි සඳහන් විගණනයට අවශ්‍ය තොරතුරු, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ලංකා සතොස ආයතනය විසින් ලබා නොදීම.

(ඉ) ඇමුණුම් 03 හි සඳහන් විගණනයට අවශ්‍ය තොරතුරු සැපයීමේදී, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහ ලංකා සතොස ආයතනයේ විශාල ප්‍රමාදයන් පැවතීම.

(ඊ) සහල් ආනයන කටයුතු සිදු කර තිබුණු 2014 සහ 2015 වර්ෂවල ආයතනයේ සේවයේ නියුක්තව සිටි ඉහළ කළමනාකරණ මට්ටමේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ වැඩි පිරිසක් දැනට ආයතනයෙන් ඉවත්ව ගොස් තිබීම නිසා තොරතුරු ලබා ගැනීමේදී සිදු වූ අපහසුතාවය / ප්‍රමාදය / නොහැකි වීම.

(උ) ආයතනයේ ගිණුම් හා තොරතුරු පවත්වාගෙන යාමේ පද්ධති සහ ක්‍රමවේදයන්ගේ විශාල දුර්වලතා පැවතීම.

(ඌ) ආනයනික සහල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයන් සඳහා පහත සඳහන් ආයතන විසින් ලංකා සතොස ආයතනයේ තොරතුරු, ලේඛන සහ ලිපිගොනු රැගෙන ගොස් තිබීම සහ ඇතැම් ලිපිගොනුවල සහ ලේඛනවල ඡායා පිටපත් ආයතනය විසින් රඳවා තබා නොගැනීම.

(i) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව (බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම)

(ii) මූල්‍ය අපරාධ පරීක්ෂණ කොට්ඨාශය

(iii) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

# 4. පොදු කරුණු

## 4.1 සමාගම සංස්ථාපනය කිරීම

ලංකා සතොස සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2005 ඔක්තෝබර් 26 දින සංස්ථාපනය කර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2010 මාර්තු 19 දින නැවත ලියාපදිංචි කර තිබුණි. එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.893,752,720 ක් වන අතර, ලංකා සතොස ආයතනයේ සභාපතිවරයා විසින් 2014 අගෝස්තු 19 දිනැතිව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර තිබුණු කොටස් නිකුතුව පිළිබඳ ආකෘති 06 අනුව එම කොටස් සංයුතිය පහත පරිදි විය. (ඇමුණුම 04)

| කොටස් හිමිකම | කොටස් ප්‍රමාණය | වටිනාකම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| භාණ්ඩාගාර ලේකම් | 87,095,381 | 870,953,810 | 97.44 |
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව | 2,279,884 | 22,798,840 | 2.55 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 7 | 70 | 0.000001 |

## 4.2 සමාගමේ අරමුණු

සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ මූලික අරමුණු පහත සඳහන් පරිදි විය. (ඇමුණුම 05)

(අ) සියලු වර්ගවල අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් සහ අනෙකුත් වෙළඳ භාණ්ඩ පාරිභෝගික ජනතාව වෙත විකිණීමේ, විකිණීමට අර්පණය, බෙදා හැරීමේ කටයුතු සිදු කිරීම.

(ආ) සමාගම සතු සිල්ලර වෙළඳසල්වලින් දැරියහැකි මිලකට පාරිභෝගික ජනතාවට මිළදී ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වෙළඳ භාණ්ඩ පවතින බවට තහවුරු කිරීම.

(ඇ) පාරිභෝගික හා අනෙකුත් ඕනෑම වර්ගයක ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ආනයනකරුවන් හා අපනයනකරුවන් සහ තොග හා සිල්ලර වෙළඳුන් හා ගනුදෙනුකරුවන් ලෙස කටයුතු කිරීම ආරම්භ කිරීම, පිහිටුවීම කළමනාකරණය සහ පවත්වාගෙන යාම, භාණ්ඩ ආනයනකරුවන් ලෙස එවැනි කටයුතු, අවශ්‍ය අවස්ථාවලදී සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙන් (ස.තො.ස) මිළදී ගැනීමට නොහැකි යැයි සිතිය හැකි භාණ්ඩවලට සීමා කළ යුතු වන්නේය.

(ඇ) කෘෂි නිෂ්පාදන, පාරිභෝගික හා අනෙකුත් සියලුම වර්ගවල භාණ්ඩ මිළදී ගන්නන්, එකතු කරන්නන්, සැකසුම්කරුවන්, ගබඩාකරුවන්, අසුරන්නන්, බෙදාහරින්නන්, විකුණුම්කරුවන් හා සපයන්නන් සම්බන්ධ කටයුතු සිදු කිරීම. භාණ්ඩ මිළදී ගන්නන් හා එකතු කරන්නන් ලෙස එවැනි කටයුතු, අදාළ අවස්ථාවලදී සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස) විසින් අදාල කාල වකවානුවේදී මිලදී නොගන්නා හෝ එකතු කර නොගන්නා හෝ භාණ්ඩවලට සීමා කළ යුතු වන්නේය.

(ඉ) පූර්ණ මිළදී ගැනීම, බදු හෝ කුලියට ගැනීමකින් ගබඩා හා වෙළඳ පහසුකම් පිහිටුවීම සහ ගුදම්, වෙළඳ සහ ගබඩා ඉඩකඩ සහ පහසුකම් විකිණීම, බදුදීම, කුලියට දීම හා අලෙවිය.

(ඊ) ව්‍යාපාර හා අනෙකුත් පෞද්ගලික ව්‍යවසායකයන් වෙත පුහුණු හා නුපුහුණු ශ්‍රමය සහ අනෙකුත් මානව සම්පත් සේවා කොන්ත්‍රාත් මගින් සැපයීම.

(උ) පාරිභෝගික ජනතාව වෙත ඕනෑම ආකාරයක සේවා සැපයීම.

(ඌ) අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර වෙළඳාම් කටයුතු සිදු කිරීම හැරුණු විට සමාගම විසින් පාරිභෝගික ජනතාව වෙත සේවය සැපයීමේ මූලික අරමුණෙන් යුතුව මෙහි සඳහන් ව්‍යාපාර කටයුතුවල නියැලීම මගින් සමාගමේ ප්‍රායෝගික, ව්‍යාපාර හා වාණිජ තිරසාරභාවය තහවුරු කිරීම.

(*සාංගමික ව්‍යවස්ථාවලියේ සිංහල පිටපතක් විගණනයට ලබා නොදීම නිසා ඉංග්‍රීසි පිටපතේ පරිවර්තනයක් මෙහි දක්වා ඇත.)

## 4.3 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද, වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින් 07 දෙනෙකු පමණක් පත් කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල බලයෙන් පත්වන නිත්‍ය සාමාජිකයකු වන සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් 2015 නොවැම්බර් 11 වැනි දින ඉවත්වී ඇති අතර, අදාල අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් 03 දෙනෙකු පත් කර නොතිබුණි. 2006 සිට මේ දක්වා සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු පහත දැක්වේ.

| | නම | අධ්‍යක්ෂ මණ්ඩල තනතුර | පත් වූ දිනය | ඉවත් වූ දිනය |
|---|---|---|---|---|
| | ------ | ------------------- | -------------- | -------------- |
| 1. | කේ.එන්.ආර්.ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ / සභාපති | 2006.12.01 | 2015.01.21 |
| 2. | ක්‍රිෂාන්ත කපුවත්ත මයා | අධ්‍යක්ෂ | 2010.05.31 | 2015.02.06 |
| 3. | ඩී.ජීවනාදන් මයා | අධ්‍යක්ෂ | 2010.06.30 | 2015.11.11 |
| 4. | චමිල ජයාන් මුණසිංහ මයා | අධ්‍යක්ෂ | 2010.07.01 | 2015.01.07 |
| 5. | එන්.එම්.ඩී.නවරත්න මයා | අධ්‍යක්ෂ | 2010.07.19 | 2015.05.25 |
| 6. | ඩී.අජිත් පී. අබේසේකර මයා | අධ්‍යක්ෂ | 2011.12.21 | 2015.01.20 |
| 7. | ඩබ්ලිව්.එච්.කරුණාරත්න මයා | අධ්‍යක්ෂ | 2012.01.16 | 2014.06.30 |
| 8. | ඩී.ඩී.උපුල් ශාන්ත ද අල්විස් මයා | අධ්‍යක්ෂ | 2014.07.01 | 2015.07.15 |
| 9. | කාසිමීර් කිරාන් අතපත්තු මයා | අධ්‍යක්ෂ / සභාපති | 2015.01.28 | 2015.08.03 |
| 10. | එස්.සේනාරත්න මිය | අධ්‍යක්ෂ | 2015.02.27 | 2015.08.03 |
| 11. | ඒ.යූ.එම්.යාසීර් මයා | අධ්‍යක්ෂ | 2015.02.27 | වර්තමාන සාමාජික |
| 12. | එම්.එච්.එම්.හඩාඩ් මයා | අධ්‍යක්ෂ | 2015.03.24 | 2016.09.10 |
| 13. | ආචාර්ය ආර්.එම්.කේ.රත්නායක මයා | අධ්‍යක්ෂ | 2015.05.25 | 2015.11.16 |
| 14. | එම්.එච්.එම්.ෂෆ්රාස් මයා | අධ්‍යක්ෂ | 2015.06.08 | වර්තමාන සාමාජික |
| 15. | සමීර ටී. ජයවර්ධන මයා | අධ්‍යක්ෂ | 2015.06.11 | 2015.07.28 |
| 16. | ජී.ඒ.අජිත් ප්‍රියන්ත මයා | අධ්‍යක්ෂ | 2015.06.11 | 2015.07.28 |
| 17. | ඩබ්ලිව්.ඒ.ධම්මික රාජපක්ෂ මයා | අධ්‍යක්ෂ | 2015.07.15 | 2015.10.08 |
| 18. | සේන ශ්‍රීනාත් මීයනවල මයා | අධ්‍යක්ෂ / වැඩ බලන සභාපති | 2015.08.03 | 2015.09.15 |
| 19. | එම්.රිස්වාන් හමීම් මයා | අධ්‍යක්ෂ | 2015.10.13 | වර්තමාන සාමාජික |
| 20. | ආචාර්ය රොහාන්ත අතුකෝරළ මයා | අධ්‍යක්ෂ / සභාපති | 2015.11.20 | වර්තමාන සභාපති |
| 21 | ආර්.රුෂාන්දන් මයා | අධ්‍යක්ෂ | 2015.12.01 | වර්තමාන සාමාජික |
| 22. | ඒ.පී.කුරුම්බලපිටිය මයා | අධ්‍යක්ෂ | 2015.12.01 | වර්තමාන සාමාජික |
| 23. | ආර්.ඒ.ඉන්දිකා රණතුංග මිය | අධ්‍යක්ෂ | 2015.12.29 | වර්තමාන සාමාජික |

## 4.4 කාර්ය මණ්ඩල තොරතුරු

2016 මැයි 31 දිනට සමාගමේ කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| ඉහළ කළමනාකරණ මට්ටම | 14 | 10 | 4 | - |
| මධ්‍යම කළමනාකරණ මට්ටම | 23 | 11 | 12 | - |
| කණිෂ්ඨ කළමනාකරණ මට්ටම | 31 | 24 | 7 | - |
| කළමනාකරණ සහකාර | 578 | 438 | 140 | - |
| ප්‍රාථමික මට්ටම | 2,429 | 2,842 | - | 413 |
| එකතුව | 3,075 | 3,325 | 163 | 413 |

## 4.5 ලංකාවේ වී නිෂ්පාදනය, දේශීය හා ආනයනික සහල් සැපයුම සහ සහල් පරිභෝජනය

(මෙ. ටො. දහස්)

| වර්ෂය | වී නිෂ්පාදනය | | මුළු වී නිෂ්පාදනය | දේශීය සහල් නිෂ්පාදනය * | ආනයනික සහල් | මුළු සහල් සැපයුම | සහල් පරිභෝජනය |
|---|---|---|---|---|---|---|---|
| | යල | මහ | | | | | |
| 2015 | 2,877 | 1,942 | 4,819 | 3,369 | 286 | 3,655 | 2,438 |
| 2014 | 2,236 | 1,145 | 3,381 | 2,364 | 600 | 2,964 | 2,404 |
| 2013 | 2,846 | 1,774 | 4,620 | 3,231 | 23 | 3,254 | 2,382 |
| 2012 | 2,717 | 1,129 | 3,846 | 2,895 | 36 | 2,931 | 2,364 |
| 2011 | 1,996 | 1,898 | 3,894 | 2,723 | 28 | 2,751 | 2,427 |

* දේශීය සහල් නිෂ්පාදනය වී මෙ.ටො. 01 කට සහල් මෙ.ටො. 0.7 ක් ලෙස ගණනය කර ඇත.

(දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014 සහ 2015 වාර්ෂික වාර්තාවල දත්ත සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැළසුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂගේ 2016 නොවැම්බර් 17 දිනැති අංක SEPC/STAT/AMD/IT(DOA) දරන ලිපියෙන් ලබාගත් තොරතුරු)

**4.6 2012 සිට 2015 වර්ෂය දක්වා පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය විසින් සිදුකල සහල් ආනයනය පිළිබඳ තොරතුරු**

(මෙ. ටො.)

| වර්ෂය | පෞද්ගලික අංශය | රාජ්‍ය අංශය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | ලංකා සතොස | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | වෙනත් රාජ්‍ය ආයතන | |
| 2015 | 118,856 | 167,265 | - | 553 | 286,674 |
| 2014 | 504,525 | 90,294 | 1,150 | 5,007 | 600,976 |
| 2013 | 21,896 | - | 1,093 | 60 | 23,049 |
| 2012 | 26,508 | - | 9,732 | - | 36,240 |
| **එකතුව** | **671,785** | **257,559** | **11,975** | **5,620** | **946,939** |

(දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුවේ දත්ත පද්ධතිය)

## 4.7 ලංකා සතොස ආයතනය විසින් සහල් මිලදීගෙන තිබූ ආකාරය

ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවලදී පහත දැක්වෙන පරිදි සහල් මිලදී ගෙන තිබුණි.

| මිලදී ගත් ආකාරය | ප්‍රමාණය (මෙ.ටො.) | මි.ර.ගැ. (CIF) වටිනාකම (රු.) |
|---|---:|---:|
| (අ) දේශීය නිෂ්පාදිත සහල් මිලදී ගැනීම | 46,668 | 2,688,941,911 |
| (ආ) ආනයනික සහල් දේශීය වෙළඳපලෙන් මිලදී ගැනීම | 18,134 | 1,199,495,609 |
| (ඇ) පසු ගෙවීම් ක්‍රමය යටතේ සෘජුවම විදේශීය වෙළඳපලෙන් සහල් මිලදී ගැනීම | 29,262 | 1,851,055,933 |
| (ඈ) ලංකා සතොස විසින් ණයවර ලිපියක් මගින් සෘජුවම විදේශීය වෙළඳපලෙන් මිලදී ගැනීම | 1,040 | 62,634,808 |
| (ඉ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත විදේශීය වෙළඳපොලෙන් මිලදී ගැනීම | 75,002 | 4,347,942,373 |
| (ඊ) මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත විදේශීය වෙළඳපලෙන් සහල් මිලදී ගැනීම | 152,255 | 9,734,901,658 |
| **එකතුව** | **322,361** | **19,884,972,292** |

## 4.8 ලංකා සතොස ආයතනයේ මාසික ආනයනික සහල් අලෙවිය

පහත සඳහන් හේතු නිසා මාසික සහල් අලෙවිය පිළිබඳ තොරතුරු ලබා දිය නොහැකි බව ලංකා සතොස ආයතනයේ සභාපතිවරයා විසින් 2016 නොවැම්බර් 28 දිනැති අංක රහිත ලිපියෙන් දන්වා එවා තිබුණි. (ඇමුණුම 06)

(අ) ලංකා සතොස අලෙවිසල් 321 ක ප්‍රමාණයක් දිවයින පුරා ස්ථාපිත කර තිබුණද, ඉන් අලෙවිසල් 220 ක්ම පරිගණක ජාලගත කර නොතිබීම.

(ආ) පරිගණක ජාලගත කර නොමැති අලෙවිසැල් 220 හි විකුණුම් තොරතුරු ප්‍රධාන පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේදී ප්‍රධාන විකුණුම් කාණ්ඩ 05 ක් යටතේ වර්ග කර ඇතුළත් කිරීම හේතුවෙන් සහල් අලෙවිය වෙනම හඳුනාගත නොහැකි වීම.

## 4.9 ලංකා සතොස ආයතනය සතුව පැවති සහල් තොග ප්‍රමාණයන්

2014 සහ 2015 වර්ෂවල එක් එක් මාසයේ අවසාන දිනට පහත දැක්වෙන පරිදි සහල් තොග පැවතුණි.

| වර්ෂය | මාසය | මාසික තොග ප්‍රමාණය (මෙ.ටො) | | | | එම සහල් තොග අලෙවිය සඳහා ප්‍රමාණවත් මාස ගණන |
|---|---|---|---|---|---|---|
| | | පොන්නි සම්බා | නාඩු | සුදු සහල් | එකතුව | |
| 2014 | ජනවාරි | | | | | |
| | පෙබරවාරි | | | | | |
| | මාර්තු | | | | | |
| | අප්‍රේල් | | | | | |
| | මැයි | | | | | |
| | ජූනි | | | | | |
| | ජූලි | | | | | |
| | අගෝස්තු | | | | | |
| | සැප්තැම්බර් | | | | | |
| | ඔක්තෝබර් | | | | | |
| | නොවැම්බර් | 5,435 | 8,943 | 32,153 | 46,531 | |
| | දෙසැම්බර් | 2,878 | 9,800 | 37,820 | 50,498 | |
| 2015 | ජනවාරි | 1,016 | 19,347 | 37,646 | 58,009 | |
| | පෙබරවාරි | 27,203 | 24,971 | 30,176 | 82,350 | |
| | මාර්තු | 23,680 | 28,604 | 33,362 | 85,646 | |
| | අප්‍රේල් | 7,828 | 14,804 | 30,427 | 53,059 | |
| | මැයි | 27,462 | 11,856 | 26,969 | 66,287 | |
| | ජූනි | 37,278 | 14,495 | 23,625 | 75,398 | |
| | ජූලි | 35,255 | 11,546 | 21,032 | 67,833 | |
| | අගෝස්තු | 35,794 | 10,387 | 18,782 | 64,963 | |
| | සැප්තැම්බර් | 51,028 | 9,352 | 16,523 | 76,903 | |
| | ඔක්තෝබර් | 50,719 | 7,830 | 13,323 | 71,872 | |
| | නොවැම්බර් | 46,847 | (29,239) | 10,468 | 28,076 | |
| | දෙසැම්බර් | 56,470 | 3,472 | 6,977 | 66,919 | |

* ලංකා සතොස ආයතනය විසින් 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල සහල් තොග ප්‍රමාණයන් සහ 2014 සහ 2015 වර්ෂවල මාසික අලෙවිය පිළිබඳ තොරතුරු ලබා නොදීම නිසා එක් එක් මාසය අවසානයේදී පවතින සහල් තොග ප්‍රමාණය අලෙවිය සඳහා ප්‍රමාණවත් මාස ගණන කොපමණද යන්න ගණනය කල නොහැකි විය.
* ඉහත සඳහන් තොරතුරුවල අලෙවිසල් 321 ක පැවැති සහල් තොග ඇතුලත් වී නොතිබුණි.
* 2015 නොවැම්බර් මස අවසානයේ පැවැති නාඩු සහල් තොගය මෙ.ටො. 29,239 ක ඌනතාවයක් ලෙස සඳහන් කර තිබීම ප්‍රශ්නගත කරුණකි.
* ගබඩාවල පැවති තොග ප්‍රමාණයන්, ගබඩා භාරකරුවන්ගෙන් දුරකතනයෙන් ලබා ගෙන තිබීම, තොග ලේඛන විධිමත්ව පවත්වා ගෙන නොයාම, තොග භෞතික සත්‍යාපන සිදු කර නොතිබීම හේතුවෙන් ලබා දී තිබුණු යථෝක්ත තොග ප්‍රමාණයන්ගේ නිවැරදිතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැක.

## 5. ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවල සහල් ආනයනය කිරීම පිළිබඳ සිදු කළ පරීක්ෂාව

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2014 සහ 2015 වර්ෂවලදී රු.15,996,534,772 ක් වැය කර සහල් මෙ.ටො. 257,559 ක්, ණයවර ලිපි විවෘත කිරීම මඟින් සහ පසු ගෙවීම් ක්‍රමය යටතේ ඉන්දියාවෙන් සහ බංග්ලාදේශයෙන් ආනයනය කර තිබුණි. මීට අමතරව රු.1,199,495,609 ක් වූ ආනයනික සහල් මෙ.ටො.18,134 ක් ද දේශීය වෙළඳපොලෙන් මිලදී ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| පසු ගෙවීම් ක්‍රමය හෝ ණයවර ලිපි අංකය | ණයවර ලිපි විවෘත කළ දිනය | ණයවර ලිපි වටිනාකම (ඇ.එ.ඩො.) | සහල් වර්ගය | සැපයුම්කරු | ලැබුණු ප්‍රමාණය (මෙ.ටො.) | මි.ර.ගැ. (CIF ) වටිනාකම (රු.) | කි.ග්‍රෑ. 1ක CIF වටිනාකම (රු.) | අරමුදල් සැපයීම |
|---|---|---|---|---|---|---|---|---|
| **1. දේශීය මිලදී ගැනීම්** | | | | | | | | |
| දේශීයව ආනයනික සහල් මිලදී ගැනීම | | | | සැපයුම්කරුවන් 14 කි | 18,134 | 1,199,495,609 | | ලංකා සතොස |
| **2. ලංකා සතොස සෘජුවම සහල් ආනයනය කිරීම** | | | | | | | | |
| පසු ගෙවීම් ක්‍රමය (DP) | | | නාඩු සහ සම්බා සහල් | සැපයුම්කරුවන් 07 කි | 29,262 | 1,851,055,933 | | ලංකා සතොස |
| 42002140026193 | 2014.09.22 | 455,000 | නාඩු සහල් | Omvishkar Exports | 1,040 | 62,634,808 | 60.23 | මහජන බැංකුව |
| **3. අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව විදේශීය වෙළඳපොලෙන් සහල් ආනයනය කිරීම** | | | | | | | | |
| 42002140024186 | 2014.09.01 | 21,500,000 | සුදු සහල් | United Foods (pvt) Ltd | 50,002 | 2,843,606,997 | 56.87 | මහජන බැංකුව |
| BTD-M 064568 | 2014.12.10 | 11,250,000 | නාඩු සහල් | බංග්ලාදේශ රජය | 25,000 | 1,504,335,376 | 60.17 | ලංකා බැංකුව |
| **4. මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත විදේශීය වෙළඳපොලෙන් සහල් ආනයනය කිරීම** | | | | | | | | |
| BTD-M 63519 | 2014.10.29 | 1,994,018 | නාඩු සහල් | ACP Industries Ltd | 4,887 | 268,319,420 | 54.90 | ලංකා බැංකුව |
| BTD-M 63519 (දීර්ඝ කිරීම) | 2015.02.17 | 18,056,000 | පොන්නි සම්බා සහල් | ACP Industries Ltd | 37,704 | 2,500,017,885 | 66.31 | ලංකා බැංකුව |
| BTD-M 63537 | 2014.10.30 | 2,403,837 | පොන්නි සම්බා සහල් | ACP Industries Ltd | 4,926 | 323,514,220 | 65.68 | ලංකා බැංකුව |
| BTD-M 63537 (දීර්ඝ කිරීම) | 2015.02.13 | 21,996,163 | පොන්නි සම්බා සහල් | ACP Industries Ltd | 43,384 | 2,861,893,578 | 65.97 | ලංකා බැංකුව |
| 42002140033283 | 2014.12.03 | 12,150,000 | සුදු සහල් | United Foods (pvt)Ltd | 30,000 | 1,630,038,846 | 54.33 | මහජන බැංකුව |
| 42002140033274 | 2014.12.03 | 15,300,000 | පොන්නි සම්බා සහල් | Trident Chemphar Ltd | 31,354 | 2,151,117,709 | 68.61 | මහජන බැංකුව |
| එකතුව | | | | | **275,693** | **17,196,030,381** | | |

ඉහත දක්වා ඇති එක් එක් සහල් මිලදී ගැනීම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

## 5.1 දේශීය වෙළඳපොළෙන් ආනයනික සහල් මෙ.ටො. 18,134 ක් මිලදී ගැනීම

ලංකා සතොස ආයතනය දේශීය වෙළඳ පොලෙහි සැපයුම්කරුවන් 14 දෙනෙකුගෙන් රු.1,199,495,609 ක් වටිනා ආනයනික සහල් මෙ.ටො.18,134 ක් 2014 අප්‍රේල් 22 දින සිට 2014 දෙසැම්බර් 12 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණි. (ඇමුණුම 07)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ලංකා සතොස ආයතනයේ කළමනාකරු-මිලදී ගැනීම් (කුළු බඩු) විසින් ඉදිරිපත් කරන ලද 2016 නොවැම්බර් 11 දිනැති අංක රහිත ලිපියට අනුව දේශීය වෙළඳපොලෙන් රු.1,199,495,609 ක් වටිනා ආනයනික සහල් මෙ.ටො. 18,134 ක් මිලදී ගෙන තිබුණ බව දක්වා තිබුණද, ලංකා සතොස සභාපතිවරයා විසින් ආනයනික සහල් පිළිබඳ විමර්ශනය සඳහා පත් කරන ලද කමිටු වාර්තාව අනුව ලංකා සතොස ආයතනය විසින් දේශීය වෙළඳපොලෙන් රු.1,457,866,378 ක් වටිනා ආනයනික සහල් මෙ.ටො. 27,072 ක් මිලදී ගත් බව සඳහන් කර තිබුණි. ඒ අනුව සහල් මෙ.ටො. 8,938 ක වෙනසක් පැවතුණි. (ඇමුණුම් 08 සහ 09)

(ආ) ලංකා සතොස ආයතනය රාජ්‍ය සමාගමක් වන බැවින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කර අනුමත කර ගත හැකිය. එසේ නොවන විටකදී 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කළ යුතුය. මෙහිදී ලංකා සතොස ආයතනය පිළියෙල කර, අනුමත කරගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් නොමැති බැවින් සැපයුම්කරුවන් 14 දෙනා තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. (ඇමුණුම 10)

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය අනුව රු.500,000 ඉක්මවන සියලු භාණ්ඩ හෝ සේවා, සැපයුම්වලදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවද රු.1,199,495,609 ක්වූ යථෝක්ත සහල් මිලදී ගැනීමේදි ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරුවන් 14 දෙනා සමග ගිවිසුම්වලට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(ඈ) ඉහත සඳහන් පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව සැපයුම්කරුවන් තෝරා ගෙන තිබීම නිසා සැපයුම්කරුවන්ගෙන් විවිධ මිල ගණන් යටතේ සහල් මිලදී ගෙන තිබුණි.

## 5.2 පසු ගෙවුම් ක්‍රමය (Documents Against Payment) යටතේ සහල් මෙ.ටො. 29,262 ක් ආනයනය කිරීම

ලංකා සතොස ආයතනය සිය වෙළඳසැල් ජාලය තුල විකිණීම සඳහා පසු ගෙවුම් ක්‍රමය යටතේ (Documents Against Payment) 2014 අප්‍රේල් 10 දින සිට 2014 දෙසැම්බර් 29 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 21 කදි රු.1,000,181,682 ක් (ඇ.එ.ඩො.7,538,520 ක්) වටිනා පොන්නි සම්බා සහල් මෙ.ටො. 14,739 ක් සහ රු.850,874,251 ක් (ඇ.එ.ඩො.6,410,550 ක්) වටිනා නාඩු සහල් මෙ.ටො. 14,523 ක් වශයෙන් එකතුව රු.1,851,055,933 ක් (ඇ.එ.ඩො.13,949,070 ක්) වටිනා සහල් මෙ.ටො. 29,262 ක් ඉන්දියානු සැපයුම්කරුවන් 07 දෙනෙකුගෙන් ආනයනය කර තිබුණි. (ඇමුණුම 12)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) පසු ගෙවුම් ක්‍රමය යටතේ සහල් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතින් ලබා ගත් බවට සාක්ෂි නොතිබුණු අතර, සියළුම අවස්ථාවලදී එනම් අවස්ථා 21 ක දීම **"සභාපතිවරයා විසින් සහල් ආනයනය කිරීම සඳහා උපදෙස් ලබාදුන් බවට"** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) විසින් නාමමාත්‍ර ඉන්වොයිසිවල (Pro-forma Invoice) සටහනක් යොදා තිබුණි. එක් නිදසුනක් ඇමුණුම 13 හි දැක්වේ.

(ආ) ඉහත 5.1(ආ) හි සඳහන් පරිදි මෙම සැපයුම්කරුවන් 07 දෙනා තෝරා ගැනීමේදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. (ඇමුණුම 10)

(ඇ) ඉහත 5.1 (ඇ) හි සඳහන් පරිදි රු.1,851,055,933 ක්වූ යථෝක්ත ආනයනය කිරීමේදී ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරුවන් 07 දෙනා සමග ගිවිසුම්වලට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(ඈ) එසේ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම නිසා 2014 අප්‍රේල් 10 දින සිට 2014 දෙසැම්බර් 29 දින දක්වා කාලපරිච්ඡේදය තුළ සහල් ආනයනය කර තිබුණු අවස්ථා 21 කදී මෙ.ටො. 01 ක් විවිධ මිල ගණන් යටතේ මිලදී ගැනීමට සිදු වී තිබුණි. (ඇමුණුම 12)

(i) අවස්ථා 12 කදි පොන්නි සම්බා සහල් මෙ.ටො. 14,739 ක් මිලදි ගෙන තිබුණ අතර, එම සහල් මෙ.ටො. 01 ක මිල ඇ.එ.ඩො. 440 සිට ඇ.එ.ඩො 535 ක් දක්වා වු එනම් සහල් කිලෝග්‍රෑම් 01 ක මිල රු.58.08 සිට රු.70.62 දක්වා වූ මිල පරාසයක පැවතුණි.

(ii) අවස්ථා 09 කදි නාඩු සහල් මෙ.ටො. 14,523 ක් මිලදී ගෙන තිබුණ අතර එම සහල් මෙ.ටො. 01 ක මිල ඇ.එ.ඩො. 385 සිට ඇ.එ.ඩො 460 ක් දක්වා වු එනම් සහල් කිලෝග්‍රෑම් 01 ක මිල රු.50.82 සිට රු.60.72 දක්වා වූ මිල පරාසයක පැවතුණි.

**5.3 2014 ජූලි 31 දිනැති අංක 14/0940/540/005 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම**

**"ආහාර සුරක්ෂිතතාවය සහ වෙළඳපොල සහල් මිල ස්ථාවර කිරීම සඳහා ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාමට"** අවශ්‍ය බව සඳහන් කරමින් එවකට සිටි සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණු 2014 ජූලි 09 දිනැති අංක 14/0940/540/005 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි. (ඇමුණුම 14)

(i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) මගින් සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම.

(ii) මෙම සහල් තොගය, ආහාර දෙපාර්තමේන්තුව සතුව පවතින ගබඩා පද්ධතිය භාවිතා කරමින් ආරක්ෂිත තොගයක් ලෙස මාස හයෙන් හයට අළුත් කරමින් සුරක්ෂිතව තබා ගැනීම.

(iii) මේ සඳහා වන පිරිවැය මහා භාණ්ඩාගාරය මගින් ලබා ගැනීම.

එම අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා සඳහා 2014 ජූලි 31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දී තිබුණි. (ඇමුණුම 15)

(i) ලක් සතොස මගින් සහල් මෙ.ටො. 5000 ක ප්‍රමාණවලින් කොටස් වශයෙන් ආනයනය කර එහි අලෙවිසල් ජාලය ඔස්සේ ඒවා අලෙවි කිරීමට ක්‍රියා කිරීම.

(ii) නොවැම්බර් සිට ජනවාරි දක්වා වන උත්සව සමය තුළ වෙළඳපලෙහි සහල් මිල ස්ථාවරව පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය වුවහොත් වෙළඳපොල වෙත නිකුත් කිරීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩා පහසුකම් භාවිත කරමින් මාස 02 ක කාලයක් සඳහා ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගැනීම.

(iii) ලක් සතොස ආයතනය සඳහා අනුමත කෙටි කාලීන ණය සීමාව ඇතුළත මේ සඳහා අවශ්‍ය අරමුදල් කළමනාකරණය කර ගැනීම.

ඒ අනුව 2014 සැප්තැම්බර් 01 දින මහජන බැංකුව මගින් විවෘත කළ අංක 42002140024186 දරන ණයවර ලිපිය මගින් United Foods Ltd නමැති ඉන්දියානු සමාගමෙන් සුදු සහල් මෙ.ටො. 50,000 ක් ඇණවුම් කර තිබුණු අතර රු.2,843,606,997 ක් වූ මෙ.ටො. 50,002 ක් 2014 සැප්තැම්බර් 17 දින සිට 2014 නොවැම්බර් 16 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ලැබී තිබුණි. (ඇමුණුම් 16 ,17 සහ 18)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

  (i) ආනයනය කළ යුතු සහල් වර්ගය නිශ්චිතව දක්වා නොතිබීම

  (ii) මාස 2 ක කාලයකට අවශ්‍ය ආරක්ෂිත සහල් තොගය නිශ්චය කර නොතිබීම

  (iii) සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) මගින් සහල් ආනයනය කිරීමට ඉල්ලුම් කර තිබුණද, ලක් සතොස මගින් සහල් ආනයනය කිරීමට අනුමත කර තිබීම.

(ආ) සහල් මෙ.ටො. 5000 ක ප්‍රමාණවලින් කොටස් වශයෙන් ආනයනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණද, එම අනුමැතියට පටහැනිව සහල් මෙ.ටො. 50,000 ම එකවර ඇණවුම් කර තිබුණි. ඒ අනුව මෙම සහල් තොගය 2014 සැප්තැම්බර් 17 දින සිට 2014 නොවැම්බර් 16 දින දක්වා දින 60 ක් වැනි කෙටි කාලයක් තුල ලැබී තිබුණි. (ඇමුණුම 18)

(ඇ) අනුමැතිය ලැබී තිබුණේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩා භාවිතා කරමින් ආරක්ෂිත සහල් තොග පවත්වා ගැනීම සඳහා වුවද, අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මෙ.ටො. 5,000 බැගින් ආනයනය නොකර එකවර මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම නිසා මෙම සහල් තොග ගබඩා කර තැබීමට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවලට අමතරව ඒකල පිහිටි පෞද්ගලික අංශයේ ගබඩාවක් ද භාවිතා කිරීමට සිදු වී තිබුණි.

(ඇ) ඉහත 5.1(ආ) හි සඳහන් පරිදි මෙම සැපයුම්කරු තෝරා ගැනීමේදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. (ඇමුණුම 10)

(ඉ) ඉහත 5.1 (ඇ) හි සඳහන් පරිදි රු.2,843,606,997 ක්වූ යථෝක්ත සහල් ආනයනය කිරීමේදී ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(ඊ) **"යථෝක්ත සැපයුම්කරු සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් නම් කර එවන ලද බව"** සභාපතිවරයා විසින් 2015 පෙබරවාරි 20 දිනැති අංක රහිත ලිපිය මගින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී තිබුණි. (ඇමුණුම 19)

(උ) දේශීයව විශාල වශයෙන් සම්බා සහ නාඩු සහල් පරිභෝජනය කරනු ලබන තත්ත්වයක් තුළ ඇණවුම් කළ යුතු සහල් වර්ගය ලෙස සුදු සහල් තෝරා ගැනීමට වෙළඳපොල අධ්‍යයනයක් සිදු කර තිබුණේද යන්න සඳහා සාක්ෂි නොවීය.

(ඍ) අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම මගින් බලාපොරොත්තු වූ වෙළඳ පොලේ සහල් මිල ස්ථාවර කිරීම, හිඟයකින් තොරව සහල් සැපයීම, හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගත හැකි පරිදි ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාම යන අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කළද, සුදු සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම මගින් එම අරමුණු ඉටු වීද යන්න සනාථ කිරීමට අදාල සාක්ෂි නොතිබුණි.

(එ) මෙම සහල් තොගය ආනයනය කිරීම සඳහා ණයවර ලිපිය විවෘත කර තිබූ 2014 සැප්තැම්බර් 01 දින වනවිටත් ලංකා සතොස ආයතනය විසින්ම සිය අරමුදල් භාවිතා කරමින් පසු ගෙවීම් ක්‍රමය (Documents against Payment) යටතේද පොන්නි සම්බා සහ නාඩු සහල් මෙ.ටො. 13,300 ක් ඇණවුම් කර එම සහල් තොගයෙන් මෙ.ටො. 3,349 ක් ලැබී තිබුණද, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීමට ණයවර ලිපිය විවෘත කිරීමේදි මේ පිළිබඳව අවධානය යොමු කර තිබූ බවක් නිරීක්ෂණය නොවීය. (ඇමුණුම් 20 සහ 21)

(ඒ) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ අංක 14/0940/540/005 දරන 2014 ජුලි 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා සහ ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා විසින් යථෝක්ත සහල් ආනයනය අධෛර්යමත් කිරීම සඳහා පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 22 සහ 23)

(i) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

i. දේශීය වෙළඳපොල තුළ ඇතිවිය හැකි සහල් හිඟය සලකා බලා 2014 අප්‍රේල් 09 දිනැති අංක 1857/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සහල් සඳහා පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කර තිබීම හේතුවෙන් පෞද්ගලික අංශයේ සහල් ආනයනකරුවන් විසින් මේ වන විටත් සහල් ආනයනය කරන හෙයින්, දේශීය වෙළඳපොල සහල් මිල ස්ථායී වී ඇති බව.

ii. සහල් මෙ.ටො. 50,000 ක් එකවර ආනයනය කළහොත් විදේශීය වෙළඳපොලෙහි සහල් සැපයුම් මිල ඉහළ යාමේ සම්භාවිතාවයක් ඇති බව.

(ii) ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

i. ආරක්ෂිතව සහල් ගබඩා කිරීම සඳහා දැනට පහසුකම් නොමැති බැවින් සහල් තොග විශාල වශයෙන් සත්ත්ව ආහාරවලට විකිණීමට සිදු වී තිබෙන බව.

ii. මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම සහ දීර්ඝ කාලීනව ගබඩා කර තබා ගැනීම මගින් රජයට මූල්‍යමය පාඩුවක් සිදු වන බව.

iii. පනවා තිබූ බදු අඩු කර නිදහසේ සහල් ආනයනය කිරීමට ඉඩ ලබා දීමෙන් පසු මෙ.ටො. 120,000 ක් පමණ සහල් තොග පෞද්ගලික අංශය ආනයනය කර ඇති බව හා ආනයනය කිරීමේ ප්‍රවණතාවය අනුව නොවැම්බර් මාසය දක්වා ආනයනය තවදුරටත් වැඩි විය හැකි බව.

iv. අක්කරෙයිපත්තුව වැනි ප්‍රදේශවල යල කන්නයේ ගොයම් කැපීම ආරම්භ කර ඇති බැවින් සහල් ආනයනය කිරීම හේතුවෙන් වී මිල පහත වැටී ගොවීන් අසහනයට පත් විය හැකි බව.

**5.4 අංක 42002140026193 දරන ණයවර ලිපිය මගින් නාඩු සහල් මෙ.ටො. 1040 ක් ආනයනය කිරීම**

ලංකා සතොස ආයතනය සිය අරමුදල් භාවිතා කරමින් 2014 සැප්තැම්බර් 22 දින මහජන බැංකුව මගින් අංක 42002140026193 දරන ණයවර ලිපියක් විවෘත කර රු.62,634,808 ක් වූ නාඩු සහල් මෙ.ටො. 1040 ක් Omwishkar Exports නැමැති ඉන්දියානු සමාගමෙන් ආනයනය කර තිබුණි. මෙම සහල් තොගය 2014 ඔක්තෝබර් 23 දින සම්පූර්ණයෙන්ම ලංකා සතොස ආයතනය වෙත ලැබී තිබුණි. (ඇමුණුම් 24 සහ 25)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ඉහත 5.1(ආ) හි සඳහන් පරිදි මෙම සැපයුම්කරු තෝරා ගැනීමේදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. (ඇමුණුම 10)

(ආ) ඉහත 5.1 (ඇ) හි සඳහන් පරිදි රු.62,634,808 ක්වූ යථෝක්ත සහල් ආනයනය කිරීමේදී ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(ඇ) 2014 සැප්තැම්බර් 22 දින වන විට ලංකා සතොස ආයතනය සිය අරමුදල් භාවිතා කර පසු ගෙවීම් ක්‍රමය යටතේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත එකතුව මෙ.ටො. 64,800 ක සහල් තොගයක් ඇණවුම් කර තිබියදීත්, ඒ පිළිබඳව නොසලකා තවදුරටත් නාඩු සහල් මෙ.ටො. 1000 ක්ද ඇණවුම් කර තිබුණි. (ඇමුණුම 20)

## 5.5 අංක BTD-M63519 සහ අංක BTD- M63537 දරන ණයවර ලිපි මගින් සහල් මෙ.ටො. 90,901 ක් ආනයනය කර තිබීම

පොන්නි සම්බා සහල් මෙ.ටො. 50,000 ක් සහ නාඩු සහල් මෙ.ටො. 50,000 ක් සැපයීමට ACP Industries Ltd නැමති ඉන්දියානු සමාගම එකඟවී ඇති බවත්, එම සහල් ආනයනය කිරීම සඳහා වහාම පියවර ගන්නා ලෙසත්, මේ සඳහා අවශ්‍ය බැංකු පහසුකම් ලංකා බැංකුව මගින් සැලසීමට කටයුතු කරන බවත්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් අංක DFD/RICE/LS-2014 හා 2014 ඔක්තෝබර් 15 දිනැති ලිපිය මගින් ලංකා සතොස සභාපතිවරයා වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව මෙම සහල් ආනයනය කිරීම සඳහා ලංකා බැංකුව මගින් අංක BTD-M 63519 සහ අංක BTD-M 63537 දරන ණයවර ලිපි 02 ක් විවෘත කිරීමට අවශ්‍ය පහසුකම් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. (ඇමුණුම් 26, 27 සහ 28)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) සහල් මෙ.ටො. 100,000 ක් සැපයීම සඳහා එකඟතාව ප්‍රකාශ කරමින් ACP Industries Ltd නැමැති ඉන්දියානු සමාගම විසින් 2014 සැප්තැම්බර් 01 දිනැති අංක ACP/201314/Oct/Export/002 දරන ලිපියක් එවකට සිටි ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත යොමු කර තිබුණද, එසේ ඍජුවම අමාත්‍යවරයෙකු වෙත එවැනි එකඟතාවයක් ප්‍රකාශ කර ලිපියක් එවීමට හේතු වූ කරුණු කිසිවක් අනාවරණය නොවීය. (ඇමුණුම 29)

(ආ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DFD/RICE/LS-2014 දරන ලිපියෙන් සහල් මෙ.ටො. 100,000 ක් ACP Industries Ltd සමාගමෙන් මිලදී ගැනීමට වහාම පියවර ගන්නා ලෙස ලංකා සතොස සභාපතිවරයා වෙත දැනුම් දී තිබුණද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. (ඇමුණුම 26)

(ඇ) එසේ සහල් මිලදී ගන්නා ලෙස 2014 ඔක්තෝබර් 15 දිනැති ලිපියෙන් සභාපතිවරයාට දැනුම්දී තිබියදීත් ඊට දින 02 කට පසු එනම් 2014 ඔක්තෝබර් 17 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් පොන්නි සම්බා සහල් මෙ.ටො. 01 ක් ඇ.එ.ඩො. 488 කටද, නාඩු සහල් මෙ.ටො. එකක් ඇ.එ.ඩො. 408 කටද (එකතුව මෙ.ටො. 100,000 ක්) මිලදී ගැනීමට ඔහුගේ 2014 ඔක්තෝබර් 17 දිනැති අංක DFD/Rice/LS/In/Acp දරන ලිපිය මගින් ACP Industries Ltd නැමති ඉන්දියානු සමාගමෙන් ඇණවුම් කර තිබුණි. (ඇමුණුම 30)

(ඇ) සහල් මෙ.ටො. 100,000 ක ප්‍රමාණය වහාම මිලදී ගැනීම සඳහා කටයුතු කරන ලෙසට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2014 ඔක්තෝබර් 15 දිනැති ලිපිය මගින් දැනුම් දීම 2014 ඔක්තෝබර් 19 දින ලංකා සතොස ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන විටත් එනම් ඊට දින 02 කට පෙර එනම් 2014 ඔක්තෝබර් 17 දින එම සහල් තොගය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් ඇණවුම් කර තිබුණි. (ඇමුණුම 31)

(ඉ) ඉහත 5.1 (ආ) හි සඳහන් පරිදි මෙම සැපයුම්කරු තෝරා ගැනීමේදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. (ඇමුණුම 10)

(ඊ) ඉහත 5.1 (ඇ) හි සඳහන් පරිදි රු.5,953,745,103 ක්වූ යථෝක්ත සහල් ආනයනය කිරීමේදී ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(උ) **"සහල් ආනයනය කළ ACP Industries Ltd නැමැති ඉන්දියානු සමාගම නම් කර එවා තිබුණේ මහා භාණ්ඩාගාරය විසින් බවත් ලංකා සතොස ආයතනය විසින් සිදු කරනු ලබන ආනයනික කටයුතු සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු හෝ තාක්ෂණ ඇගයීම් කමිටු පත් කර නොමැති බවත්"** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2015 මාර්තු 11 දිනැති අංක CIT/6/8/Import/Rice දරන ලිපියෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා යවා තිබුණි. (ඇමුණුම 32)

(ඌ) 2014 ඔක්තෝබර් 15 දින වන විට ලංකා සතොස ආයතනය සිය අරමුදල් භාවිතයෙන් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සහල් මෙ.ටො. 91,210 ක් ඇණවුම් කර තිබියදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් සතොස සභාපති වෙත සහල් මෙ.ටො. 100,000 ක ප්‍රමාණයක් ආනයනය කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ ඇණවුම් කළ සහල් තොගයෙන් මෙ.ටො. 57,086 ක් යථෝක්ත සහල් ආනයනය සඳහා ණයවර ලිපි 02 විවෘත කළ 2014 ඔක්තෝබර් 29 සහ 30 දෙදින වන විටත් ලැබී තිබුණි. (ඇමුණුම් 20 සහ 21)

(එ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් සහල් ඇණවුම් කළ, 2014 ඔක්තෝබර් 17 දිනැති ලිපියෙන් සියළු සහල් තොග (මෙ.ටො. 100,000) 2014 දෙසැම්බර් 31 දිනට පෙර සපයන ලෙස ඉන්දියානු සමාගමට දන්වා යවා තිබුණද, විවෘත කර තිබූ ණයවර ලිපි 2015 පෙබරවාරි 20 දින කල් ඉකුත් වනවිටත් ලැබී තිබුණේ පොන්නි සම්බා සහල් මෙ.ටො. 4,926 ක් සහ නාඩු සහල් මෙ.ටො. 4,887 ක් පමණකි. (ඇමුණුම් 30 සහ 33)

(ඒ) යථෝක්ත ණයවර ලිපිවල කාලය ඉකුත් වීමට පෙර නැව්ගත කිරීමට නොහැකිවූ ඉතිරි සහල් තොග නැවත නැව්ගත කිරීම සඳහා ණයවර ලිපිවල කාලය තවදුරටත් දීර්ඝ කර දෙන ලෙසට ඉන්දීය සමාගම විසින් 2015 පෙබරවාරි 09 දිනැති අංක ACP/Exports/2015/02/011 දරන ලිපිය මගින් ලංකා සතොස සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබුණි. (ඇමුණුම 34)

(ඔ) ආනයනික සහල් තොග තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2015 පෙබරවාරි 12 දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී 2015 පෙබරවාරි 20 දින කල් ඉකුත්වීමට තිබූ ණයවර ලිපි 02 සංශෝධනය කර, ණයවර ලිපිවල ඉතිරි වටිනාකම් සඳහා පොන්නි සම්බා සහල් ආනයනය කිරීමටත්, ඒ අනුව ණයවර ලිපි සංශෝධනය කිරීමටත්, ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීමටත්, අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, මේ වනවිට මහ කන්නයේ වී අස්වනු වෙළඳපලට ලැබෙමින් පැවතීම, ලංකා සතොස ගබඩාවල පැවැති සහල් තොග සහ පෞද්ගලික අංශය සතුව පැවති සහල් තොග යන කරුණු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. (ඇමුණුම 35)

(ඕ) මේ පිළිබඳව මහා භාණ්ඩාගාරය දැනුවත් කරන ලෙස අමාත්‍යවරයා උපදෙස් ලබා දී තිබුණද, එයට පටහැනිව අනුමැතියකින් තොරව පසු දිනම එනම්, 2015 පෙබරවාරි 13 දිනැති අංක රහිත ලිපිය මගින් ලංකා සතොස ආයතනයේ අධ්‍යක්ෂවරයෙකුගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ අත්සනින් ණයවර ලිපිවල කාලය 2015 අප්‍රේල් 20 දින දක්වා දීර්ඝ කරන ලෙස ලංකා බැංකුව වෙත දන්වා යවා තිබුණි. එම ලිපියට අධ්‍යක්ෂවරයෙකු ලෙස අත්සන් කර තිබුණේ ඒ වන විටත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකි. ඒ අනුව මෙම නිලධාරියාට ණයවර ලිපි දීර්ඝ කිරීමට තිබූ අධිකාර බලය කුමක්ද යන්න පැහැදිලි නොවීය. (ඇමුණුම 36)

(ක) **"2014/15 මහ කන්නයේ වී අස්වැන්න වෙළඳපල වෙත ලැබෙමින් පවතින නිසා කල් ඉකුත් වූ ණයවර ලිපිවල කාලය තවදුරටත් දීර්ඝ නොකරන ලෙස භාණ්ඩාගාරයේ ලේකම් විසින් උපදෙස් ලබා දුන් බව"** 2015 පෙබරවාරි 25 දිනැති අංක DFD/RICE/LS-2014 දරන ලිපිය මගින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා යවා ඇතත් ඒ වන විටත් එනම්, 2015 පෙබරවාරි 20 දින ලංකා බැංකුව එකතුව රු.5,361,911,463 ක් වූ ණයවර ලිපි 02 හි කාලය 2015 අප්‍රේල් 17 දින දක්වා දීර්ඝ කර තිබුණි. (ඇමුණුම් 37, 38 සහ 39)

(ග) ණයවර ලිපි 02 හි ඇපකරය 2015 ජුලි 31 දින දක්වා දීර්ඝ කර දෙන මෙන් ලංකා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විසින් 2015 මාර්තු 04 දිනැති අංක රහිත ලිපියෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගෙන් ඉල්ලා තිබුණද, **"මහා කන්නයේ අස්වැන්න ලැබෙමින් පවතින නිසාත්, වෙළඳපොලේ සහල් තොග පවතින නිසාත්, එම ණයවර ලිපිවල ඇපකරය දීර්ඝ නොකරන ලෙස භාණ්ඩාගාරයේ ලේකම් උපදෙස් ලබාදී ඇති බැවින් ඇප විය හැක්කේ මුල් ණයවර ලිපි 02 හි වලංගු කාලය දක්වා ආනයනය කර ඇති සහල් ප්‍රමාණය සඳහා පමණක් බව"** 2015 මාර්තු 17 දිනැති අංක DFD/RICE/LS-2014 දරන ලිපියෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් බැංකුව වෙත දන්වා යවා තිබුණි. එසේ දන්වා යවා තිබියදීත් ඊට දින 15 කට පසු එනම් 2015 අප්‍රේල් 01 දිනැති අංක DFD/RICE/LS – 2014 දරන ලිපියෙන් **"මුදල් අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දුන් බව"** සඳහන් කරමින් මුල් ණයවර ලිපිවලට ලබා දී ඇති ඇපකර කාලය 2015 අප්‍රේල් 30 දින දක්වා වලංගු බැවින්, 2015 මාර්තු 17 දින එවන ලද ලිපිය ඉවත් කර ගන්නා බව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා දන්වා තිබුණි. (ඇමුණුම් 40, 41 සහ 42)

(ජ) 2014 නොවැම්බර් 05 දිනැති මුල් ණයවර ලිපිවල 46 A (8) වගන්තියෙහි **"ලංකා සතොස ආයතනය මගින් නම් කරනු ලබන නියෝජිතයෙකු විසින් සහල්වල තත්ත්වය, ප්‍රමාණය සහ ඇසුරුම් අදාල ප්‍රමිතිවලට අනුකූලද යන්න තහවුරු කිරීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු බවට" (Quality certificate issued by Representative of the Applicant certifying that quality, quantity and packing conform to the specifications stated under field 45A of the Letter of Credit. The name of the Representative and his passport number will be notified to the adising Bank in due course)** සඳහන් කර තිබුණු කොන්දේසිය පසුව එනම් 2014 නොවැම්බර් 18 දින සංශෝධනය කර **" මෙ.ටො. 5,000 ක් දක්වා SGS India (Pvt) Ltd නම් ඉන්දියානු ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන තත්ත්ව සහතික මත" (Should be amended to read as Quality Certificate up to 5000 MT of Ponni Samba (GRII) with 5 pct broken issued by SGS India (Pvt) Ltd, India certifying that quality, quantity and packing conform to specification stated under field 45A of Letter of Credit)** ගෙවීම් කිරීමේ කොන්දේසිය ඇතුළත් කර තිබුණි.

එම කොන්දේසියද, ලංකා සතොස ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකුගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ අත්සනින් ණයවර ලිපි දීර්ඝ කිරීම සඳහා යවා තිබුණු 2015 පෙබරවාරි 13 දිනැති අංක රහිත ලිපිය මගින් ඉවත් කර ඒ වෙනුවට **"සැපයුම්කරුගේ වියදමින් (ඉන්දියන් සමාගම) ස්වාධීන ආයතනයක් විසින් සහල් පිළිබඳව ඉදිරිපත් කරන ප්‍රමිත සහතික මත ගෙවීම් කිරීමට ලංකා බැංකුවට උපදෙස් ලබා දී තිබුණි." (Should be deleted and pls include Quality Certificate has been issued by the reputed independent survey at beneficiary cost and conforms to the specifications stated under field 45A of the Letter of Credit)** (ඇමුණුම් 27, 28, 43 සහ 44)

(ට) උක්ත ණයවර ලිපි 02 යටතේ ආනයනය කර තිබූ සහල් නිෂ්කාශනයට අදාලව මුළු ලිපිගොනු 169 අතරින් ලිපිගොනු 60 ක් සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී එම ලිපිගොනු 09 ක ප්‍රමිති සහතික ඉදිරිපත් කර නොතිබුණු බවත්, තවත් ලිපිගොනු 02 ක ඇතුළත් කර තිබූ ප්‍රමිති සහතික එම ආනයනය කල සහල් තොගයට අදාල නොවූ ප්‍රමිති සහතික බවත් අනාවරණය විය. (ඇමුණුම් 45)

(ඩ) ACP Industries Ltd නැමැති ඉන්දියානු සමාගම විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත යොමු කළ 2014 සැප්තැම්බර් 01 දිනැති අංක ACP/201314/OCT/EXPORTS/002 දරන ලිපියෙහි **"සමාගමට අයත් වගා බිම්වලින් නිෂ්පාදිත සහල් සපයන බවට"** ප්‍රකාශ කර තිබුණද, නියැදියට තෝරාගත් යථෝක්ත ලිපිගොනු 60 හිම එම සමාගම වෙනුවට වෙනත් සමාගම් විසින් සහල් සැපයීමට කටයුතු කර තිබුණි. (ඇමුණුම් 29 සහ 46)

(ණ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් 2014 ඔක්තෝබර් 31 දිනැති අංක TO/REV/LC/443 දරන ලිපිය මගින් **"අවලංගු කළ නොහැකි (Irrevocable) ණයවර ලිපියක් විවෘත කරන ලෙසට"** ලංකා බැංකුවට ලබාදුන් දැනුම් දීමට පටහැනිව ACP Industries Ltd නැමැති සැපයුම්කරුගේ 2014 ඔක්තෝබර් 24 දිනැති අංක ACP/201314/OCT/EXPORT/009 දරන නාමමාත්‍ර ඉන්වොයිසියේ (Pro-forma Invoice) දක්වා තිබූ පරිදි **"වෙනත් පාර්ශවයන් වෙත පැවරිය හැකි" (Irrevocable Transferable)** ලෙස ලංකා සතොස ආයතනය විසින් ණයවර ලිපිය විවෘත කරදී තිබීම හේතුවෙන් ACP Industries Ltd ආයතනය අතරමැදියෙකු ලෙස කටයුතු කරමින් වෙනත් සමාගම් මගින් සහල් සැපයීමට අවස්ථාව සලසා ගෙන තිබුණි. (ඇමුණුම් 47 සහ 48)

(ත) මෙම වාර්තාවේ 5.3 ඡේදයේ දැක්වෙන සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම සඳහා ලබාදී තිබුණු 2014 ජුලි 31 දිනැති අංක 14/0940/540/005 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ලංකා සතොස ආයතනය සුදු සහල් මෙ.ටො. 50,000 ක් ඇණවුම් කර 2014 ඔක්තෝබර් 29 දින වන විට එයින් සහල් මෙ.ටො. 36,399 ක් ලැබී තිබියදීත්, සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කල 2014 ඔක්තෝබර් 23 දිනැති අංක CIT/5/6/සහල් ආනයනය දරන ලිපියෙහි නැවත වරක් යථෝක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතියම සඳහන් කරමින් මෙම සහල් මෙ.ටො. 100,000 ආනයනය කිරීම සඳහා ඇ.එ.ඩො. මිලියන 45 ක ණය මුදලක් ලංකා සතොස ආයතනය වෙත ලබා දීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙස දන්වා තිබීම ප්‍රශ්නකාරී විය. (ඇමුණුම් 15, 21 සහ 49)

**(ද) සහල් අඩංගු බහාළුම් වරායෙන් නිදහස් කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වී තිබීම**

(i) ණයවර ලිපි විවෘත කළ මුල් අවස්ථාවේදීම සහල් තොග කඩිනමින් ඉවත් කර ගැනිම සඳහා **"ආනයනය කරනු ලබන සහල් තොග පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීමේ පහසුකම් (Green Channel Facility) සලසා දෙන ලෙස"** සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2014 නොවැම්බර් 13 දිනැති අංක DFD/RICE/LS–2014 දරන ලිපියෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා තිබුණද, අංක BTD-M 63519 හා අංක BTD-M 63537 දරන ණයවර ලිපිවලින් ආනයනය කර තිබූ මුළු සහල් ප්‍රමාණය වූ මෙ.ටො. 90,901 කින්, සහල් මෙ.ටො. 42,992 ක් එනම් සියයට 47.3 කට ආසන්න ප්‍රමාණයක් වරායෙන් නිදහස් කර ගැනීම සඳහා මාස 04 සිට මාස 10 දක්වා කාලයක් ගත වී තිබුණි. විශේෂයෙන්ම බහාළුම් 398 ක් සහ 245 ක් නිදහස් කර ගැනීම සඳහා පිළිවෙලින් මාස 9 ක් හා මාස 10 ක දීර්ඝ කාලයක් ගත වී තිබුණි. (ඇමුණුම 50 සහ 51)

(ii) මහා භාණ්ඩාගාරයේ සහ ලංකා සතොස ආයතනයේ නිලධාරීන්ගේ මෙන්ම රේඛීය අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි වරාය අධිකාරිය විසින් ප්‍රමාද කුලී අය නොකිරීමේ දින 60 ක, සහන කාලයක් ලබාදී තිබියදීත් බහාළුම් කඩිනමින් නිදහස් කර ගැනීම සඳහා ලංකා සතොස ආයතනය විසින් කටයුතු කර නොතිබුණ බැවින්, සහන කාලයෙන් අනතුරුව 2015 ජූනි 24 දින වන විට ප්‍රමාද කුලී (Demurrage) ලෙස රු.362,058,214 ක්ද ඇතුළත්ව අනෙකුත් ගාස්තු ලෙස රු.506,703,785 ක මුදලක් ලංකා සතොස ආයතනය විසින් ගෙවිය යුතු බවට වරාය හා නාවික අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාට යොමු කළ 2015 ජූලි 10 දිනැති අංක එම්පීඑස්/06/15/02-04 දරන ලිපියෙන් දන්වා තිබුණි. (ඇමුණුම 52)

(iii) අංක BTD-M 63519 හා BTD-M 63537 දරන ණයවර ලිපි 02 දීර්ඝ කිරීමේදී ඒ වනවිටත් අනෙකුත් ණයවර ලිපි හා පසු ගෙවීම් ක්‍රමය යටතේ ඇණවුම් කර ලැබුණු සහල් ප්‍රමාණය පිළිබඳ මෙන්ම ඒ අවස්ථාව වනවිට පවත්නා ගබඩාවල ඉඩකඩ සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු කර නොතිබීම හේතුවෙන් සහල් විශාල ප්‍රමාණයක් විනාශ වීමට මෙන්ම අනවශ්‍ය මූල්‍ය බැඳියාවකට යටත් වීමටද ලංකා සතොස ආයතනයට සිදු වී තිබුණි.

(iv) එමෙන්ම මනුෂ්‍ය පරිභෝජනය සඳහා ආනයනය කළ සහල් උචිත පාරිසරික තත්ත්වයන් යටතේ විධිමත් ක්‍රමවේදයකින් බැහැරව වරාය පරිශ්‍රය තුළ දීර්ඝ කාලයක් ආනයනය කළ බහාළුම් තුළම තැබීමට කටයුතු කර තිබීම හේතුවෙන් එම සහල් තොග විනාශවී තිබුණි.

**(න) වරාය පරිශ්‍රයෙන් නිදහස් කරගත් සහල් අඩංගු බහාළුම් 809 ක් පෞද්ගලික බහාළුම් අංගන 02 ක නැවත ගබඩා කර තිබීම හා ඒ සඳහා රු.15,638,362 ක් ගෙවා තිබීම**

අංක BTD-M 63519 හා BTD-M 63537 දරන ණයවර ලිපි 02 යටතේ ආනයනය කළ සහල් අඩංගු බහාළුම් මාස 10 ක් වැනි කාලයක් වරාය පරිශ්‍රයේ රඳවා තබාගෙන නිදහස් කර ගැනීමෙන් අනතුරුවද එම බහාළුම්වල අඩංගු සහල් විධිමත් ගබඩාවන්හි ගබඩා කිරීම වෙනුවට ඒස් බහාළුම් අංගනය (ACE Container Yard) සහ ඒසියන් බහාළුම් අංගනය (Asian Container Yard) යන අංගනයන්හි නැවත රඳවා තබා ගැනීමට ලංකා සතොස ආයතනය කටයුතු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම පෞද්ගලික බහාළුම් අංගනයන් තාවකාලික බහාළුම් රඳවා ගැනීමේ ස්ථානයන් ලෙස පවත්වා ගෙන යනු ලබන අතර, බහාළුම් රඳවා තබා ගන්නා කාලය සඳහා එක් බහාළුමක් සඳහා දිනකට රු.150 බැගින් බිම් කුලියක් ලංකා සතොස ආයතනය විසින් ගෙවිය යුතුව තිබුණි.

(ii) මාස 10 ක් වැනි කාලයක් වරාය පරිශ්‍රයේ රඳවා තිබූ බහාළුම් නිදහස් කර ගැනීමෙන් අනතුරුව 2016 ජනවාරි මාසයේ සිට තවදුරටත් මෙම පෞද්ගලික බහාළුම් අංගනයන්හි රඳවා තැබීමට කටයුතු කර තිබුණි.

(iii) ලංකා සතොස ආයතනය හා බහාළුම් අංගන මගින් ලබා ගත් තොරතුරු අනුව සහල් මෙ.ටො. 21,034 ක් අඩංගු බහාළුම් 809 ක් මෙම බහාළුම් අංගනවල රඳවා තැබීමට කටයුතු කර තිබුණු අතර, එම බහාළුම් අතරින් බහාළුම් 727 ක ප්‍රමාණයක් මාස 02 ත් 10 ත් අතර කාලපරිච්ඡේදයකට පසුව රැගෙන යාමට ලංකා සතොස ආයතනය විසින් කටයුතු කර තිබුණි. (ඇමුණුම 53)

(iv) එමෙන්ම 2016 ඔක්තෝබර් 14 දින විගණනය විසින් සිදු කළ භෞතික පරීක්ෂාවේදී ACE බහාළුම් අංගනයේ සහල් මෙ.ටො. 2,152 ක් අඩංගු බහාළුම් 82 ක් රඳවා තිබූ අතර, එම බහාළුම්, 2016 ජනවාරි මස එම අංගනයට ගෙන එන ලැබූ ඒවා විය. ඒ අනුව, මෙම බහාළුම් මාස 09 කට අධික කාලයක් එම අංගනය තුළද රඳවා තැබීමට කටයුතු කර තිබුණි. (ඇමුණුම 54)

(v) එම බහාළුම් අංගනයේ තිබුණු බහාළුම් 82 න් බහාළුම් 02 ක් අහඹු ලෙස තෝරා විවෘත කර පරීක්ෂා කරන ලද අතර, එම බහාළුම් තුළට ජලය ඇතුල් වී තිබීම හේතුවෙන් සහල් කුණු වී අධික දුර්ගන්ධ තත්ත්වයන්ද, පණුවන් හා වෙනත් කෘමි සතුන් සිටින බවද නිරීක්ෂණය විය. ඡායාරූප පහත දැක්වේ.





(vi) සහල් වැනි පාරිභෝගික ද්‍රව්‍ය අඩංගු බහාළුම් ගබඩා කිරීමට යෝග්‍ය පාරිසරික තත්ත්වයන් මෙම අංගනයන් තුළ දක්නට නොලැබුණු අතර, දීර්ඝ කාලයක් වර්ෂාවට මෙන්ම අධික උෂ්ණත්වයට භාජනය වීම හේතුවෙන් මෙහි ගබඩා කර තිබූ සහල් කිසිදු අයුරකින් හෝ මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු තත්ත්වයක තිබිය නොහැකි බව නිරීක්ෂණය විය. විශේෂයෙන්ම වරාය පරිශ්‍රය තුළ මාස 10 කට ආසන්න කාලයක්ද, පෞද්ගලික බහාළුම් අංගන තුළ තවත් මාස 09 කට ආසන්න කාලයක්ද වශයෙන් මාස 19 කට අධික කාලයක් මෙම බහාළුම් අවිධිමත්ව ගබඩා කර තිබුණි.

(vii) ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී විසින් 2016 නොවැම්බර් 03 දින විගණනයට ලබා දුන් තොරතුරු අනුව බහාළුම් රඳවා තැබීම සඳහා බිම් කුලිය වශයන් රු.15,638,362 ක මුදලක් 2016 සැප්තැම්බර් 20 දින දක්වා කාලයට අදාල බහාළුම් ආයතනවලට ගෙවා තිබුණි. එමෙන්ම 2016 නොවැම්බර් 16 දින වනවිටත් බහාළුම් 54 ක් එම අංගනය තුළ රඳවා තැබීම හේතුවෙන් තවදුරටත් එම බහාළුම් සඳහා බිම් කුලී වශයෙන් ගෙවීමටද නියමිතව තිබුණි. (ඇමුණුම 55 සහ 56)

## 5.6 අංක 42002140033274 සහ 42002140033283 දරන ණයවර ලිපි මගින් සහල් මෙ.ටො. 61,354 ක් ආනයනය කිරීම

මැතිවරණ සමයේදී (2015 වර්ෂයේ ජනාධිපතිවරණය) සහල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාමේ ප්‍රවණතාවය අධෛර්යමත් කිරීමේ උපාය මාර්ගයක් ලෙස ලංකා සතොස ආයතනය හරහා සහන මිලට සහල් බෙදා හැරීමේ රජයේ තීරණය සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා එවකට සිටි සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා, 2014 නොවැම්බර් 28 දිනැති අංක රහිත ලිපිය මඟින් භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් කළ ඉල්ලීම පරිදි 2014 දෙසැම්බර් 03 දින මහජන බැංකුව මගින් විවෘත කරන ලද, අංක 42002140033274 දරන ණයවර ලිපියෙන් Trident Chempher Ltd නැමති ඉන්දීය සමාගමෙන් සහ අංක 42002140033283 දරන ණයවර ලිපියෙන් United Foods (Pvt) Ltd නැමැති ඉන්දීය සමාගමෙන් පිළිවෙලින් සුදු සහල් මෙ.ටො. 30,000 ක් සහ පොන්නි සම්බා සහල් මෙ.ටො. 31,354 ක් රුපියල් 3,781,156,555 ක් වැය කර ආනයනය කර තිබුණි. (ඇමුණුම් 57, 58,59,60 සහ 61)

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) සහන මිලට සහල් නිකුත් කිරීම සඳහා 2014 නොවැම්බර් 28 දිනැති අංක රහිත ලිපිය මඟින් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් පොන්නි සම්බා සහ නාඩු සහල් මෙ.ටො. 50,000 බැගින් ආනයනය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම, **"මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් මෙ.ටො. 30,000 බැගින් සංශෝධනය කළ බවට"** සටහනක් එම ලිපියෙහිම යොදා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2014 දෙසැම්බර් 01 දිනැති අංක DFD/RICE/LS-2014 දරන ලිපියෙන් පොන්නි සම්බා සහල් මෙ.ටො. 30,000 ක් සහ සුදු සහල් මෙ.ටො. 30,000 ක් ගෙන්වීමට භාණ්ඩාගාරයේ එකඟතාවය දක්වා තිබුණද, මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. (ඇමුණුම 57 සහ 62)

(ආ) එසේ අනුමැතියක් නොතිබියදීත් සහල් ආනයනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලංකා සතොස ආයතනය වෙත ලබාදෙන ලෙසට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින් 2014 දෙසැම්බර් 04 දිනැති අංක TO/REV/LC/449 දරන ලිපිය මගින් මහජන බැංකුව වෙත උපදෙස් ලබාදී තිබුණි. (ඇමුණුම 63)

(ඇ) ඉහත 5.1(ආ) හි සඳහන් පරිදි Trident Chempher Ltd සහ United Foods (Pvt) Ltd නමැති ඉන්දීය සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. (ඇමුණුම 10)

(ඈ) ඉහත 5.1(ඇ) හි සඳහන් පරිදි රු.3,781,156,555 ක්වූ යථෝක්ත සහල් ආනයනය කිරීමේදී ලංකා සතොස ආයතනය විසින් සැපයුම්කරුවන් දෙදෙනා සමග ගිවිසුම්වලට එළඹ නොතිබුණි. (ඇමුණුම 11)

(ඉ) ඉහත 5.3 (ඊ) හි සඳහන් පරිදි යථෝක්ත සැපයුම්කරුවන් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මඟින් නම් කර එවා තිබුණි. (ඇමුණුම 19)

(ඊ) 2014 දෙසැම්බර් 03 දින වන විටත් ලංකා සතොස ආයතනය සිය අරමුදල් භාවිතයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සහ භාණ්ඩාගාරයේ එකඟතාවය මත මෙ.ටො. 193,460 ක් ඇණවුම් කර තිබියදීත් මෙම සහල් මෙ.ටො. 60,000 ආනයනය කිරීමට ණයවර ලිපි විවෘත කර තිබුණි. මෙම ඇණවුම් කළ සහල් ප්‍රමාණයෙන් මෙ.ටො. 78,794 ක් 2014 දෙසැම්බර් 03 දින වන විටත් ලැබී තිබුණි. (ඇමුණුම් 20 සහ 21)

(උ) 2014 සැප්තැම්බර් 01 දින විවෘත කළ ණයවර ලිපිය මගින් ඇණවුම් කළ සුදු සහල් මෙ.ටො. 50,000 ක ප්‍රමාණය 2014 නොවැම්බර් 09 දින වන විට ලැබී තිබියදීත් ඒ පිළිබඳ නොසලකා 2014 දෙසැම්බර් 03 දින ද සුදු සහල් මෙ.ටො. 30,000 ක් ඇනවුම් කිරීම හේතුවෙන් 2014 වර්ෂය තුල ඇණවුම් කළ මුළු සුදු සහල් ප්‍රමාණය මෙ.ටො. 80,000 ක් විය.

## 5.7 රජයකින් රජයකට ලබාදෙන පදනම මත බංග්ලාදේශ රජයෙන් නාඩු සහල් මෙ.ටො.25,000 ක් ආනයනය කිරීම

ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා සහල් මෙ.ටො. 50,000 ක් බංග්ලාදේශ රජයෙන් ලබා ගැනීම යන මැයෙන් 2014 නොවැම්බර් 12 දිනැති අංක DFD/CM/2014-03 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව බංග්ලාදේශ රජය සමඟ 2014 දෙසැම්බර් 03 දින ඇති කරගත් ගිවිසුමකට අනුව නාඩු සහල් මෙ.ටො. 25,000 ක් රු.1,504,335,376 කට මිලදී ගෙන තිබුණි. (ඇමුණුම් 64 සහ 65)
යථෝක්ත අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉල්ලා තිබුණු පහත සඳහන් යෝජනා සඳහා 2014 නොවැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. (ඇමුණුම 66)

(i) මෙ.ටො. එකක් ඇ.එ.ඩො. 450 බැගින් සහල් මෙ.ටො.50,000 ක් බංග්ලාදේශ රජයෙන් ලබා ගැනීම සඳහා බංග්ලාදේශයේ ආහාර අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹීම සඳහා ලංකා සතොස ලිමිටඩ් ආයතනය වෙත බලය ලබා දීමට.

(ii) මෙම සහල් මෙ.ටො. 50,000 ආනයනය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලංකා බැංකුව විසින් ලංකා සතොස ලිමිටඩ් ආයතනයට ලබා දීමට.

(iii) ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් ලංකා සතොස ආයතනයට සහල් ආනයනය සඳහා ලබාදෙන මූල්‍ය පහසුකම් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැපයීමේ ලිපි ලබා දීමට මහා භාණ්ඩාගාරයට බලය ලබා දීමට.

මේ පිළිබඳව නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) බංග්ලාදේශ රජයෙන් සහල් මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, එයට පටහැනිව සහල් මෙ.ටො. 25,000 ක් ආනයනය කිරීම සඳහා පමණක් 2014 දෙසැම්බර් 03 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ අනුව අනුමත සහල් ප්‍රමාණයට වඩා අඩු සහල් ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා හේතු වූ කරුණු කුමක්ද යන්න අනාවරණය නොවීය. (ඇමුණුම 65 සහ 66)

(ආ) 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 8.9.3 හා රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ අංක 8.9.3 ප්‍රකාරව රු.මි. 500 ට සමවන හෝ ඉක්මවන වැඩ හා සේවා සැපයීමේ කොන්ත්‍රාත්වලට අදාල ගිවිසුම් අත්සන් කිරීම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සිදු කළ යුතු වුවද, එයට පටහැනිව රු.1,504,335,376 ක් වටිනා සහල් මෙ.ටො. 25,000 ක් ආනයනය කිරීම සඳහා බංග්ලාදේශ රජය සමඟ එළඹ තිබූ ගිවිසුමට ලංකා සතොස ආයතනයේ සභාපතිවරයා විසින් අත්සන් කර තිබුණි. (ඇමුණුම 11)

(ඇ) 2014 දෙසැම්බර් 10 දින වන විට ලංකා සතොස ආයතනය සිය අරමුදල් භාවිතයෙන්, අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සහ භාණ්ඩාගාර එකඟතාවය යටතේ සහල් මෙ.ටො. 253,460 ක් ආනයනය කිරීමට කටයුතු කරමින් පැවති අතර ඒ වන විටත් එම සහල් තොගයෙන් මෙ.ටො. 80,154 ක් ලැබී තිබුණි. ඉතිරි තොග ලැබෙමින් පැවතුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. (ඇමුණුම් 20 සහ 21)

(ඈ) 2014 සැප්තැම්බර් 24 දිනැති අංක bhc-col/14/230.06 දරන බංග්ලාදේශ මහ කොමසාරිස්ගේ ලිපිය අනුව මෙම සහල් තොග පිළිබඳ ප්‍රමිතිය, මිල, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළු කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් විශේෂඥතාවය ඇති කණ්ඩායමකට බංග්ලාදේශයේ ඩකා අගනුවර වෙත පැමිණෙන ලෙසට ආරාධනා කර තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාරයේ නිලධාරීන් 03 දෙනෙකු සහ ලංකා සතොස ආයතනයේ සභාපතිවරයා 2014 සැප්තැම්බර් 30 දින සිට 2014 ඔක්තෝබර් 02 දින දක්වා සහභාගී වී තිබුණි. (ඇමුණුම් 67 සහ 68)

(ඉ) විශේෂඥතාවයක් ඇති කණ්ඩායමක් බංග්ලාදේශයට එවන ලෙස දන්වා තිබුණද, සහල්වල ප්‍රමිතිය පිළිබඳ විශේෂඥතාවයක් තිබූ නිලධාරියෙක් එයට සහභාගී වූයේද යන්න පැහැදිලි නොවීය.

## 6. ආනයනික සහල් ඉතිරි තොගය

ලංකා සතොස ආයතනය විසින් ආනයනය කර තිබුණු සහල් ප්‍රමාණය සහ අලෙවි කල සහල් ප්‍රමාණය අනුව 2016 නොවැම්බර් 30 දිනට පහත දැක්වෙන පරිදි සහල් මෙ.ටො. 23,751 ක් එනම් ආනයනය කළ මෙ.ටො. 257,559 ක් වූ සහල් තොගයෙන් සියයට 9.22 ක්ම තවදුරටත් ගබඩාවල සහ බහාළුම් තුල තිබිය යුතුය. (ඇමුණුම 69 සහ 70)

| | මෙ.ටො. |
|---|---:|
| ආනයනය කළ සහල් ප්‍රමාණය | 257,559 |
| මනුෂ්‍ය පරිභෝජනය සඳහා අලෙවි කළ සහල් ප්‍රමාණය | (176,208) |
| | 81,351 |
| සත්ත්ව ආහාර සඳහා අලෙවි කළ සහල් ප්‍රමාණය | (57,600) |
| 2016 නොවැම්බර් 25 දිනට තිබිය යුතු ඉතිරි සහල් ප්‍රමාණය | 23,751 |

මේ පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2016 නොවැම්බර් 30 දින ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී විසින් ඉදිරිපත් කරන ලද සහල් ආනයන සහ විකුණුම් පිලිබඳ තොරතුරු ගැලපීමෙන් අනතුරුව 2016 නොවැම්බර් 25 දින වන විට තිබිය යුතු ඉතිරි සහල් තොගය මෙ.ටො. 23,751 ක් වුවද 2016 නොවැම්බර් 30 දින කළමණාකරු (මෙහෙයුම්) විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව එදිනට පැවති ඉතිරි තොගය මෙ.ටො. 15,804 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ඉතිරි සහල් තොගයේ මෙ.ටො. 7,947 ක වෙනසක් පැවතුණි. (ඇමුණුම 69, 70 සහ 71)

(ආ) ගබඩා තුළ සහ බහාළුම් තුළ තිබුණු ඉතිරි සහල් තොග මේ වනවිට විශාල ලෙස විනාශ වෙමින් පැවතුණි.

(ඇ) තොග වාර්තා නිවැරදිව පවත්වා ගෙන නොයාම හේතුවෙන්ද සියළුම අලෙවිසල් ජාලගත නොකිරීම හේතුවෙන්ද ඉතිරි තොගයේ ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඈ) මෙම ඉතිරි සහල් තොගය තුල ACE බහළුම් අංගනයේ රඳවා ඇති බහළුම් 54 කට අදාල සහල් මෙ.ටො. 1,404 ක් ඇතුලත් වන අතර එම සහල් තොගය ආනයනය කර මාස 19 ක් ඉකුත් වී තිබුණද, තවදුරටත් ආනයනය කළ බහාළුම් තුළම තිබුණි. (ඇමුණුම් 56)

(ඉ) 2016 නොවැම්බර් 25 දිනට පැවතිය යුතු මෙ.ටො. 23,751 ක් වූ තොගය කුමන වර්ගවලට (පොන්නි සම්බා, නාඩු සහ සුදු සහල්) අදාල සහල් තොගද යන්න පිළිබඳ තොරතුරු නොතිබුණි.

(ඊ) 2016 නොවැම්බර් 25 දිනට පැවතිය යුතු පිරිවැය රු.1,543,815,000 ක් (23,751,000 x 65) පමණ වන මෙ.ටො. 23,751 ක් වූ ඉතිරි සහල් තොගය ආනයනය කර එදිනට මාස 19 කට අධික කාලයක් ඉකුත් වී තිබුණද, විනාශ වෙමින් පැවති එම සහල් තොග පිළිබඳව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද යන්න මෙතෙක් තීරණය කල බවට සාක්ෂි නොවීය.

## 7. ආනයනික සහල් සඳහා දරන ලද මුළු පිරිවැය

වරාය හා නාවික අමාත්‍යවරයා, ලංකා සතොස ආයතනයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්, ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සහ මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි විසින් පිළිවෙලින් 2016 ජුලි 10 දිනැතිව, 2016 නොවැම්බර් 03, 29 සහ 30 දිනැතිව, 2016 දෙසැම්බර් 01 දිනැතිව, 2016 දෙසැම්බර් 10 දිනැතිව සහ 2016 නොවැම්බර් 29 දිනැතිව ලබා දී තිබුණු තොරතුරු අනුව ආනයනික සහල් මෙ.ටො. 257,559 ක් මිලදී ගැනීම සඳහා පහත සඳහන් පරිදි එකතුව රු.27,011,980,142 ක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. (ඇමුණුම් 52,55,72,73,74 සහ 75)

| වියදම් වර්ගය | වටිනාකම (රු.) |
|---|---|
| ආනයනික සහල් මෙ.ටො. 257,559 හි CIF වටිනාකම | 15,996,534,772 |
| ගෙවිය යුතු රේගු බදු | 5,835,656,743 |
| ගෙවූ සහ ගෙවිය යුතු ණය පොලිය (ලංකා බැංකුව සහ මහජන බැංකුව) | 1,931,434,240 |
| ආනයනික සහල් නිෂ්කාශන, ප්‍රවාහන සහ ප්‍රමාද ගාස්තු | 1,712,645,855 |
| වරායට ගෙවූ සහ ගෙවිය යුතු ප්‍රමාද කුලී සහ අනෙකුත් වියදම් | 694,325,310 |
| වරාය ගාස්තු | 404,307,958 |
| පෞද්ගලික ගබඩා සඳහා කුලී | 213,038,701 |
| ගෙවූ රේගු බදු | 132,770,828 |
| ගබඩා කම්කරු ගාස්තු | 52,100,114 |
| ධූමායනය කිරීමේ වියදම් | 15,318,179 |
| මහජන බැංකුවේ හිඟ ණය වෙනුවෙන් ගෙවිය යුතු දණ්ඩන පොලිය | 7,994,752 |
| ගබඩා රක්ෂණ ගාස්තු | 6,455,731 |
| රජයේ ගබඩා සඳහා තැන්පතු | 5,287,830 |
| ගබඩා විදුලි වියදම් | 1,932,160 |
| රජයේ ගබඩා සඳහා කුලී | 1,849,969 |
| නීති වියදම් | 327,000 |
| මුළු එකතුව | 27,011,980,142 |

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ආනයනික සහල් මෙ.ටො. 257,559 ක් වෙනුවෙන් 2016 දෙසැම්බර් 10 දින වන විට රු.27,011,980,142 ක් ගෙවා / ගෙවිය යුතු බැවින් ආනයනික සහල් කිලෝ ග්‍රෑම් 01 ක පිරිවැය රු.105 ක් වී තිබුණි.

(ආ) ආනයනික සහල් නිෂ්කාශනය, ප්‍රවාහන හා ප්‍රමාද ගාස්තු ලෙස 2014, 2015 සහ 2016 වර්ෂවලදී වැය කර තිබුණු රු.1,712,645,855 ක මුදලින් රු.1,502,852,590 ක් ලිවර්පූල් නැවිගේෂන් ආයතනයට (නිෂ්කාශන නියෝජිත ආයතනය) අත්තිකාරම් ලෙස ලබා දී තිබුණු අතර, එසේ ලබා දුන් මුදලින් රු.302,963,336 ක් 2016 ඔක්තෝබර් 18 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි. (ඇමුණුම 76)

(ඇ) මහජන බැංකුවේ ණය වාරික නිසි පරිදි නොගෙවීම හේතුවෙන් 2016 නොවැම්බර් 21 දිනට රු.7,994,752 ක දණ්ඩන පොලියක් ගෙවිය යුතුව තිබුණි. (ඇමුණුම 75)

(ඈ) 2015 ජනවාරි 15 දිනෙන් පසුව ලංකා සතොස ආයතනය විසින් ආනයනය කර තිබූ සහල් මෙ.ටො. 148,750 ක් සඳහා ශ්‍රී ලංකා රේගුවට ගෙවිය යුතුව පැවති එකතුව රු.5,835,656,743 ක් වූ පහත සඳහන් බදු මුදල් 2015 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ඉතුරුම් මඟින් නිරවුල් කිරීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (එවකට ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය) විසින් කටයුතු කළ යුතු වුවද 2016 නොවැම්බර් 30 දින වන විටත් එම හිඟ බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම හිඟ මුදල අයවැය ප්‍රතිපාදන මඟින් ඉදිරියේදී අමාත්‍යාංශයට ගෙවීමට සිදු වන බැවින් රු. 5,835,656,743 ක් වූ එම බදු මුදල් රජයට දැරීමට සිදු වී තිබුණි. (ඇමුණුම 73)

ගෙවිය යුතු රේගු බදු හා අනෙකුත් බදු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
|---|---|---|
| | -------------------- | ------------------------- |
| | රු. | රු. |
| රේගු බදු (CID) | 476,560,000 | 1,020,495,000 |
| වරාය හා ගුවන් තොටුපළ බදු (PAL) | 45,014,388 | 97,030,524 |
| ජාතිය ගොඩනැගීමේ බදු (NBT) | 30,237,832 | 65,343,957 |
| එකතු කළ අගය මත බදු (VAT) | 166,307,996 | 351,741,266 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) | 3,582,925,780 | - |
| | ------------------ | ------------------ |
| | 4,301,045,996 | 1,534,610,747 |
| | =========== | ========== |

(ඉ) රු.1,931,434,240 ක් වූ ගෙවූ සහ ගෙවිය යුතු බැංකු ණය පොලිය මහජන බැංකුව සහ ලංකා බැංකුව පිළිවෙලින් 2016 නොවැම්බර් 21 දින සහ 2016 දෙසැම්බර් 09 දින දක්වා පමණක් ගණනය කර ඇති බැවින් තවදුරටත් ගෙවිය යුතුව පවතින රු.7,786,400,532 ක් වූ ණය මුදල සඳහා එම දිනයන්ගෙන් පසු කාලපරිච්ඡේදය සඳහා ද ණය පොලි ගෙවිය යුතුව පවති. (ඇමුණුම් 74 සහ 75)

(ඊ) ගබඩාවල සහ පෞද්ගලික අංගනවල මෙ.ටො. 23,751 ක සහල් තොග පවතින බැවින් ගබඩා කුලි, විදුලි වියදම්, පෞද්ගලික බහාළුම් අංගනය සඳහා කුලි, සහල් බහළුම් සඳහා ප්‍රමාද කුලි, ප්‍රවාහන වියදම් සහ කම්කරු ගාස්තු 2016 සැප්තැම්බර් 30 න් පසුව තවදුරටත් ගෙවිය යුතුව පවතී.

## 8. ආනයනික සහල් අලෙවියෙන් ලැබූ මුළු ආදායම

ලංකා සතොස ආයතනයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී විසින් විගණනයට ඉදිරිපත් කළ 2016 නොවැම්බර් 30 දිනැති තොරතුරු අනුව ආනයනික සහල් සහන මිලට අලෙවි කිරීම සහ සත්ත්ව ආහාර සඳහා අලෙවි කිරීමෙන් ලංකා සතොස ආයතනය පහත දැක්වෙන පරිදි එකතුව රු.11,854,949,124 ක අලෙවි ආදායමක් ලබා ගෙන තිබුණි. (ඇමුණුම 69 හා 70)

| වර්ෂය | සහල් වර්ගය | අලෙවි කළ ප්‍රමාණය | අලෙවි කළ මිල (කි.ග්‍රෑ. එකක්) | විකිණීමෙන් ලද ආදායම |
|---|---|---|---|---|
| --------------- | ----------------- | ----------- | ----------- | ----------------- |
| | | (කි.ග්‍රෑ.) | රු. | රු. |
| 2014 | සුදු සහල් | 19,233,670 | 50 | 961,683,495 |
| | නාඩු සහල් | 27,982,128 | 55 | 1,539,017,034 |
| | පොන්නි සම්බා | 55,608,410 | 60 | 3,336,504,573 |
| 2015 | සුදු සහල් | 53,789,534 | 50 | 2,689,476,705 |
| | නාඩු සහල් | 7,234,819 | 55 | 397,915,050 |
| | පොන්නි සම්බා | 12,359,204 | 60 | 741,552,267 |
| 2016 | සත්ව ආහාර | 57,600,000 | 38 | 2,188,800,000 |
| | | ---------------- | | ------------------- |
| **එකතුව** | | **233,807,765** | | **11,854,949,124** |
| | | ======== | | ========== |

මේ පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **"සහන මිලට සහල් අලෙවිය සඳහා ජනාධිපතිවරයාගෙන් අමාත්‍යවරයාට උපදෙස් ලැබී තිබූ බව"** ලංකා සතොස සභාපති ඇමතූ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2014 නොවැම්බර් 27 දිනැති අංක CIT/6-13/Import දරන ලිපියෙහි සඳහන් කර තිබුණද, එම මිල ගණන් තීරණය කළ පදනම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. (ඇමුණුම 77 )

(ආ) **"2015 ජනවාරි 01 දින සමූපකාර සමිති නියෝජිතයින් සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් අතර පැවති සාකච්ඡාවේදී සහල් සහන මිලට අලෙවි කිරීම සඳහා තීරණය කළ බව"** සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් ඇමතු 2015 ජනවාරි 02 දිනැති අංක DFD/CIT/2015 දරන ලිපියෙහි සඳහන් කර තිබුණද, එම මිල ගණන් තීරණය කළ පදනම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. (ඇමුණුම 78)

(ඇ) **"මුදල් අමාත්‍යවරයා විසින් පොන්නි සම්බා සහල් විකුණුම් මිල 2015 ජුලි 15 දින සිට රු.75 සිට රු.69 දක්වා අඩු කිරීමට උපදෙස් ලබා දුන් බව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බව"** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් ලංකා සතොස සභාපති ඇමතු 2015 ජුලි 15 දිනැති අංක 101/Sec/Ins/01 දරන ලිපියෙහි සඳහන් කර තිබුණද, එම මිල ගණන් තීරණය කළ පදනම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. (ඇමුණුම 79)

(ඈ) ලංකා සතොස ආයතනය, ආනයනය කර තිබුණු මෙ.ටො. 257,559 ක් වූ සහල් තොගයෙන් මෙ.ටො. 3,048 ක් 2015 නොවැම්බර් 17 දින පැවති ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු තීරණයෙන් සහ සහල් මෙ.ටො. 85,000 ක්, 2016 මාර්තු 16 දිනැති අංක 16/0454/723/14 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සත්ත්ව ආහාර සඳහා විකිණීමට තීරණය කර තිබුණි. ඒ අනුව ආනයනය කර තිබූ මෙ.ටො. 257,559 ක් වූ සහල් තොගයෙන් මෙ.ටො. 57,600 ක්ම එනම්, සියයට 22.36 ක්, 2016 ඔක්තෝබර් 16 දින වන විට කිලෝග්‍රෑම් 01 ක් රු.38 බැගින් රු.2,188,800,000 කට විකුණා තිබුණි. (ඇමුණුම් 69, 80 සහ 81)

## 9. සහල් ආනයනය කිරීම නිසා රු.15,157,031,018 ක අලාභයක් ලංකා සතොස ආයතනයට / රජයට සිදු වී තිබීම

ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවලදී සිදුකර තිබුණු ආනයනික සහල් සඳහා 7 ඡේදයේ දැක්වෙන පරිදි රු.27,011,980,142 ක පිරිවැයක් දැරීමට සිදු වුවද, 8 ඡේදයේ දැක්වෙන පරිදි සහල් අලෙවියෙන් ලැබී තිබුණේ රු.11,854,949,124 ක් පමණි. ඒ අනුව සහල් ආනයනය කිරීමෙන් ලංකා සතොස ආයතනයට / රජයට රු.15,157,031,018 ක අලාභයක් සිදු වී තිබුණි.

## 10. සහල් ආනයනය සඳහා අරමුදල් සපයා ගැනීම

සහල් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම මහජන බැංකුව හා ලංකා බැංකුව හරහා සිදු කර එම බැංකුවලින් ණයවර ලිපි සඳහා එකතුව රු.14,086,576,123 ක් වූ ණය මුදලක් ලබාගෙන තිබූ අතර, පිළිවෙලින් 2016 නොවැම්බර් 21 සහ 2016 දෙසැම්බර් 09 දින වනවිට ඉන් රු.8,939,763,519 ක් තවදුරටත් ණය සහ පොලී ලෙස ගෙවීමට තිබුණි. විස්තර පහත දැක්වේ. (ඇමුණුම් 74 සහ 75)

| බැංකුව | ලබාගත් ණය මුදල | 2016.11.21 / 12.09 දින වන විට ගෙවා තිබූ ණය මුදල | ගෙවා තිබූ පොලිය | ගෙවිය යුතු ණය මුදල | ගෙවිය යුතු පොලිය සහ දණ්ඩන පොලිය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ලංකා බැංකුව | 7,449,088,123 | 901,489,803 | 224,267,074 | 6,547,598,320 | 1,114,170,335 |
| මහජන බැංකුව | 6,637,488,000 | 5,398,685,788 | 561,798,931 | 1,238,802,212 | 39,192,652 |
| | 14,086,576,123 | 6,300,175,591 | 786,066,005 | 7,786,400,532 | 1,153,362,987 |

මේ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) යථෝක්ත බැංකුවලට ගෙවිය යුතු ණය සහ පොලිය පිළිවෙලින් රු.8,336,067,913 ක් සහ රු.418,335,864 ක් එනම් එකතුව රු.8,754,403,777 ක් භාණ්ඩාගාරයෙන් ගෙවීම සඳහා 2016 මාර්තු 24 දිනැති අංක 16/0454/723/014 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, එම ණය මුදල භාණ්ඩාගාරය මෙතෙක් ගෙවා නොතිබුණි. (ඇමුණුම 81)

(ආ) එකතුව රු.6,000,000,000 (ඇ.එ.ඩො. 45,000,000) ක් වූ BTD–M 63519 හා BTD-M 63537 දරන ණයවර ලිපි 02 කල් පිරෙන අවස්ථාව වනවිට එනම්, 2015 පෙබරවාරි 20 දින වන විට එම ණයවර ලිපි දෙක මගින් රු.591,833,640 ක් වටිනා සහල් මෙ.ටො. 9,813 ක් පමණක් ආනයනය කර තිබුණි. නමුත් පසුව වෙළඳපොල සහල් අවශ්‍යතාවය සහ පවත්නා තොග තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කර උක්ත සඳහන් ණයවර ලිපි 02 නැවත දීර්ඝ කිරීමට කටයුතු නොකළේ නම්, ලංකා බැංකුවෙන් රු.5,361,911,463 ක් වටිනා ණය මුදල් ලබා නොගෙන සිටීමට හැකියාව තිබුණි. ඒ අනුව ණයවර ලිපි 2 හි කාලය දීර්ඝ නොකළේ නම්, 2016 දෙසැම්බර් 09 දිනට ලංකා බැංකුවට ගෙවීමට තිබුණු ණය මුදල හා පොලිය වූ රු. 7,661,768,655 ක් වෙනුවට රු.1,388,332,244 ක් පමණක් වීමට ඉඩ තිබුණි. (ඇමුණුම් 33,74 හා 75)

## 11. ආනයනික සහල් සඳහා අතිරේක ගබඩා පහසුකම් ලබා ගැනීමට සිදු වීම

ලංකා සතොස ආයතනය වෙළඳපොල සහල් අවශ්‍යතාවය සහ පවත්නා ගබඩා ප්‍රමාණයන් පිළිබඳ අවධානය යොමු නොකර ආනයනය කර තිබූ සහල් තොග කෙටි කාලපරිච්ඡේදයක් තුළ ලැබීම හේතුවෙන් ඒ වන විටත් භාවිතා කරමින් තිබූ ගබඩාවලට අමතරව රජයේ හා පෞද්ගලික අංශය සතු ගබඩා මාසික කුලී ගෙවීමේ පදනමින් ලබා ගැනීමට සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩා 10 ක් හා පෞද්ගලික ආයතන / පුද්ගලයන්ට අයත් ගබඩා 10 ක් ලබාගෙන තිබූ අතර, 2014 සිට 2016 සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට හා පෞද්ගලික අංශයන්ට පිළිවෙලින් රු.7,137,799 ක් හා රු.213,038,701 ක් වශයෙන් එකතුව රු.220,176,500 ක් ගෙවීමට සිදු වී තිබුණි. (ඇමුණුම 72 සහ 82)

(ආ) ඉහත 5.1(ආ) හි සඳහන් පරිදි ගබඩා තෝරා ගැනීමේදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබුණි. ඒ හේතුවෙන් ගබඩාවල ප්‍රමාණය, මිල ගණන්, ගබඩාවල තත්ත්වය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවකින් තොරව ගබඩා ලබා ගැනීමට කටයුතු කර තිබුණි. (ඇමුණුම 10)

(ඇ) ප්‍රසම්පාදන පටිපාටියක් අනුගමනය නොකිරීම හේතුවෙන් එම ගබඩා සඳහා මාසික කුලිය ගෙවීමේදීද අයිතිකරුවන් ඉදිරිපත් කළ මිනුම් මත ගෙවීම් කර තිබුණු අතර, පසුව ලංකා සතොස ඉංජිනේරු අංශය විසින් සිදු කළ භෞතික මිනුම් පරීක්ෂාවේදී ගබඩා 07 කට අදාලව අයිතිකරුවන් විසින් ඉදිරිපත් කළ මිනුම් තොරතුරු සාවද්‍ය බව අනාවරණය කරගෙන තිබුණි. ඒ අනුව ලංකා සතොස ආයතනය විසින් ගබඩා කුලී වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.9,246,260 ක මුදලක් 2016 නොවැම්බර් 04 දින ආපසු අයකර ගෙන තිබුණි. (ඇමුණුම 83)

(ඇ) සහල් ගබඩා කිරීමට සුදුසු තත්ත්වයේ ගබඩා නොවීම

(i) ඒකල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික හිමිකරුවෙකුට අයත් ගබඩා 03 ක් ලබා ගෙන තිබුණු අතර එම ගබඩා අතහැර දමා තිබූ කර්මාන්ත ශාලාවක ගොඩනැගිලි බවට ගබඩා භාරකරු සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ප්‍රකාශ ලබා දී තිබුණි. මෙම ගබඩා කඩතොළු සහිත සිමෙන්ති දමන ලද බිමකින්ද, වහලවල් සිදුරු සහිත ස්ථාන පැවතීමද, දොරවල් අතර ඉඩ සහිත නිසා මීයන්, බල්ලන් වැනි සතුන්ටද, කුරුල්ලන්ට ඇතුළු විය හැකි ආකාරයේ පැවති බව එම ගබඩාවල ස්වභාවය පිළිබඳ භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) වේයන්ගොඩ ගබඩාවල පවත්නා දුර්වලතාවයන් සම්බන්ධයෙන් වේයන්ගොඩ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් 2016 මාර්තු 11 දින අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අංක B/398/16 දරන වැඩිදුර වාර්තාව මගින්ද අනාවරණය කර තිබුණි. (ඇමුණුම් 84)

(iii) එමෙන්ම අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණය විසින් වේයන්ගොඩ ගබඩා කර ඇති සහල් සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස 2016 මාර්තු 21 දින ගන්නෝරුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට නියෝග කර තිබුණි. එම නියෝගය පරිදි 2016 මැයි 11 දින අධිකරණයට ඉදිරිපත් කළ වාර්තාවේ ගබඩාවල පවත්නා දුර්වලතාවයන් සම්බන්ධයෙන් පහත කරුණු ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 85)

- ❖ ගබඩා අංක 01, 08 හා 13 සනීපාරක්ෂාවට අහිතකර, අසතුටුදායක තත්ත්වයේ පවතින බව
- ❖ බිත්ති හා වහලවල් හානි වී ඇති බව
- ❖ වහලවල් හා බිත්තිවලින් වැහි වතුර කාන්දු වී ඇති බව
- ❖ සැලකිය යුතු ප්‍රමාණයක හානි වූ සහල් මිටි හා නරක් වූ සහල් පවතින බව

(ඉ) සහල් ගබඩා කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබීම

(i) වේයන්ගොඩ හා ඒකල පිහිටි ගබඩාවල සහල් ගබඩා කිරීම ආරම්භ කරන අවස්ථාව වන විට ගබඩා භාරකරුවන් අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් ඒ වනවිටත් ලංකා සතොස ආයතනයේ **"විවිධ අංශ සහයක"** ලෙස කටයුතු කළ නිලධාරීන් දෙදෙනෙකු පත් කිරීමට කටයුතු කර තිබුණද, එම පත් කිරීම් ලිඛිතව ලබා දීමට කටයුතු කර නොතිබුණි. ගබඩා පරිපාලනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් හෝ අත්දැකීමක් නොමැති නිලධාරින් පත් කිරීමට මෙන්ම පත් කළ නිලධාරින්ට ගබඩා නඩත්තු කිරීම, සහල් ගබඩා කිරීමේ ක්‍රමවේදය, ලේඛනගත කිරීම, නිකුත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුහුණුවක් ලබා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ii) සහල් සහිත බහාළුම් ගබඩා වෙත ගෙන ඒමේදී බහාළුම්වල අඩංගු සහල් ප්‍රමාණය (මිටි ගණන), සහල් වර්ගය, බර පිළිබඳ තොරතුරු ඇතුළත් තොරතුරක් / ලේඛනයක් ගබඩා භාර නිලධාරින්ට ලබා දීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ගබඩාවල බර කිරීමේ උපකරණ ස්ථාපිත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(iii) අධික බහාළුම් ප්‍රමාණයක් ලැබීමද, ගබඩා කිරීම සම්බන්ධයෙන් දැනුමක් නොමැති වීමද හේතුවෙන් සහල් ගබඩා කිරීමේදී ප්‍රථමයෙන් ලැබෙන සහල් ප්‍රථමයෙන් නිකුත් කළ හැකි වන අයුරින් (FIFO) ගබඩා කිරීමට නොහැකි වීමෙන් ප්‍රථමයෙන් ලැබුණු සහල් තොග දීර්ඝ කාලයක් ගබඩාවල පැවතුණි. (ඇමුණුම 80)

(iv) එමෙන්ම සහල් ගබඩා කිරීමේදී භෞතික ගණනයකට මෙන්ම ධූමායනය වැනි ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කිරීමට හැකි අයුරින් ගබඩා කිරීමටද කටයුතු කර නොතිබුණ අතර, ලීවලින් තැනූ වේදිකා වෙනුවට මතුපිට පොළව මත ගබඩා කිරීමට කටයුතු කර තිබුණි. (ඇමුණුම 80)

(v) වරාය පරිශ්‍රයේ සහ පෞද්ගලික බහාළුම් අංගනයන්හි දීර්ඝ කාලයක් සහල් අඩංගු බහාළුම් රඳවා තැබීම හේතුවෙන් විනාශ වී තිබූ සහල් තොගයන්ද කිසිදු පරීක්ෂාවකින් තොරව හොඳ තත්ත්වයේ සහල් ගබඩාවලම ගබඩා කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් හොඳ තත්ත්වයේ පැවති සහල්ද කඩිනමින් විනාශ වීමට හේතු වී තිබුණි. (ඇමුණුම 80)

(vi) ආනයනික සහල් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 ඔක්තෝබර් 16 දින ආහාර කොමසාරිස්වරියගේ සභාපතිත්වයෙන් පත් කළ පංච පුද්ගල කමිටුව විසින් ලබා දුන් වාර්තාවෙහිද ගබඩා ක්‍රමවේදයන්හි පවත්නා දුර්වලතාවයන් සම්බන්ධ තොරතුරු අනාවරණය කර තිබුණි. (ඇමුණුම 80)

**(ඊ) භෞතික තොග ගණනයක් කිරීමට කටයුතු කර නොතිබීම**

වේයන්ගොඩ හා ඒකල පිහිටි ගබඩා සඳහා පිළිවෙලින් 2014 ඔක්තෝබර් 08 හා 2014 නොවැම්බර් 25 දින සිට සහල් ලැබී තිබුණු අතර, එසේ ලැබුණු සහල් ප්‍රමාණයේ නිවැරදිතාවය ගණනය කිරීම, ගබඩා කර ඇති ආකාරය පරීක්ෂා කිරීම සහ ලේඛනවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා ලංකා සතොස ආයතනය විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් පවත්නා සහල් තොගවල ප්‍රමාණය සම්බන්ධයෙන් ගබඩා භාරකරුවන් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල නිවැරදිතාවය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

## 12. පොදු නිරීක්ෂණ

(අ) ලංකා සතොස ආයතනයේ නිකුතු ප්‍රාග්ධනයෙන් සියයට 97.5 ක්ම මහා භාණ්ඩාගාරයේ ලේකම් සතු වුවද, යථෝක්ත වාර්තාවේ අඩංගු නිරීක්ෂණ සලකා බැලීමේදී භාණ්ඩාගාර ලේකම් විසින් නිසි සැලකිල්ලක්/ උපදේශනයක් දක්වා තිබුණු බවට සාක්ෂි නොවීය. (ඇමුණුම 04)

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් එවන ලද 2016 නොවැම්බර් 07 දිනැති අංක SEPC/STAT/AUDIT/(DOA) දරන ලිපියෙහි තොරතුරුවලට අනුව 2014 වර්ෂයේ හැර 2012, 2013 හා 2015 වර්ෂවල දේශීය සහල් නිෂ්පාදනය, සත්‍ය පරිභෝජනය ඉක්මවා ගොස් තිබුණද, 2012, 2013 සහ 2015 වර්ෂවලදී සහල් ආනයනය කර තිබුණි.
(ඇමුණුම 86)

(ඇ) 2014 වර්ෂයේදී දේශීය වශයෙන් පරිභෝජනය කිරීමට ප්‍රමාණවත් සහල් තොග ඌනතාවයක් පැවතියදීත් 2013 සහ 2014 වර්ෂයන්හිදී සමූපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) විසින් සහල් මෙ.ටො. 4015 ක් ඩුබායිහි පිහිටි Prateek General Trading ආයතනය වෙත අපනයනය කර ඇති බව සතොස විසින් 2015 පෙබරවාරි 06 දින ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ වාර්තාවෙහි දැක්වේ. (ඇමුණුම 87)

(ඈ) ජීවන වියදම හා රටේ පාරිභෝගික ද්‍රව්‍ය සම්බන්ධ තීරණ ගනු ලබන ජීවන වියදම් අනුකාරක සභාවට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනවල නිලධාරින් /අදාල සභාපතිවරුන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සහභාගී වුවද, නිවැරදි තොරතුරු පදනම් කරගෙන අනුකාරක සභාව විසින් තීරණ ගත් බව අනාවරණය නොවීය.

(ඉ) ආනයනය සඳහා තීරණ ගනු ලබන අවස්ථාවලදී රට තුළ දේශීය සහල් නිෂ්පාදනය, වී අලෙවි මණ්ඩලයේ පවතින වී තොග, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී ආනයනය කර තිබූ සහල් තොග සහ පෞද්ගලික අංශය සතුව පවතින සහල් තොග සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

(ඊ) ලංකා සතොස ආයතනය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු සහ දත්තවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පැවතුණි.

(උ) බහාළුම් තුළ අඩංගු සහල් පිළිබඳ ලිඛිත තොරතුරු නොමැති වීම, බර කිරීම සඳහා උපකරණ නොමැති වීම, දිනකට අති විශාල බහාළුම් සංඛ්‍යාවක් පැමිණීම හේතුවෙන්ද (සමහර දිනයන්හිදී බහාළුම් 90 කට වඩා පැමිණ ඇත) බහාළුම්වල අඩංගු සහල් ප්‍රමාණය, වර්ගය පිළිබඳ නිවැරදි තොරතුරු ලේඛනගත කිරීමට ගබඩා භාරව කටයුතු කළ නිලධාරින්ට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් ගබඩා භාරකරුවන් සතු ලේඛනවල සඳහන් සහල් ප්‍රමාණය හා ආනයනික ලේඛනවල (නෞභාරපත්‍ර) සඳහන් ප්‍රමාණය අතර වෙනස්කම් නිරීක්ෂණය විය. විගණනය විසින් සිදු කළ නියැදි පරීක්ෂාවකදී ආනයනික ලේඛන (Bill of Lading) 05 කට අදාලව බහාළුම් 134 කින් ආනයනය කළ නාඩු සහල් ප්‍රමාණය මෙ.ටො. 3,562 ක් ලෙස සඳහන් වුවද, ගබඩා භාරකරුවන්ගේ ලේඛන අනුව ලැබුණු සහල් ප්‍රමාණය මෙටො. 3,379.6 ක් ලෙස සඳහන් කර තිබීම හේතුවෙන් මෙ.ටො. 182.4 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, මෙවැනි වෙනස්කම් සම්බන්ධයෙන් ලංකා සතොස ආයතනය කිසිදු පරීක්ෂාවක් කර නොතිබුණි. (ඇමුණුම 88)

(ඌ) ලංකා සතොස ආයතනයේ මාසික සහල් අලෙවිය පිළිබඳ තොරතුරු හා පැවැති තොග පිළිබඳ නිවැරදි තොරතුරු ලබා නොදීම නිසා මෙම සහල් ඇණවුම් කරන අවස්ථාවේ ලංකා සතොස ආයතනය සතුව පැවැති තොග තත්ත්වයන් පිළිබඳ විශ්ලේෂණයක් කළ නොහැකි විය.

## 13. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ තොරතුරු පද්ධතියට සියළුම අලෙවිසල් හා ගබඩා ජාලගත නොවීම.

(ආ) ගබඩාවල විධිමත් තොග පාලන ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම.

(ඇ) ගිණුම් තැබීමේ කටයුතුවලදී විධිමත් ලෙස ආදායම් වියදම් වර්ගීකරණය හා ඒ වෙනුවෙන් ලිපිගොනු පවත්වාගෙන යාම දුර්වල මට්ටමක පැවතීම. එම නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ බොහෝ ප්‍රමාදයන් පැවතීම.

(ඈ) ඉහළ කළමනාකරණයේ බොහෝ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කර තිබීම නිසා ආයතනයේ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දුර්වල මට්ටමක පැවතීම.

(ඉ) අභ්‍යන්තර විගණන විමසීම්වලට පිළිතුරු දීම හා ක්‍රියාමාර්ග ගැනීම් ප්‍රමාණවත් පරිදි සිදු නොවීම.

(ඊ) ආයතනයේ ප්‍රධාන තීරණ ගැනීම සෑම විටම අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදු නොවන අතර, විවිධ අවස්ථාවලදී සභාපතිවරයා, මහා භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යාංශය ඒ සඳහා ප්‍රබලවම මැදිහත්වීම.

(උ) ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීමේදී සහ ඉවත්ව යාමේදී රාජකාරි ලිපිගොනු ලිඛිතව විධිමත්ව භාරදීම්/ භාරගැනීම් දුර්වල තත්ත්වයක පැවතීම.

(ඌ) ප්‍රසම්පාදන කටයුතුවලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව කටයුතු කිරීම.

(එ) ආයතනයේ නිලධාරීන්ට ලිඛිතව කාර්යය පැවරුම් ලබා දී නොතිබීම.
(ඇමුණුම් 88)

## 14. නිර්දේශ

පහත සඳහන් නිර්දේශයන් කරනු ලැබේ.

(අ) ජීවන වියදම් අනුකාරක සභාවට සහභාගී වන අමාත්‍යාංශ සහ ඒ යටතේ පවතින ආයතනවල නිලධාරින් අමාත්‍ය මණ්ඩලය වෙත අදාල තොරතුරු නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව.

(ආ) සහල් නිෂ්පාදනය, ඉල්ලුම සහ ආනයනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී රටේ සමස්ථ තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව යන ආයතනවල දත්ත සහ තොරතුරු කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු බව.

(ඇ) රාජ්‍ය සමාගමක් වන ලංකා සතොස ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු විසින් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු බව.

(ඈ) සහල් ආනයනය කිරීම පිළිබඳ තීන්දු තීරණ ගැනීමට ප්‍රථම රටේ දේශීය සහල් අවශ්‍යතාවය, වී නිෂ්පාදනය, සමස්ථ තොග මට්ටම් පිළිබඳ නිවැරදි දත්ත ලබා ගත යුතු බව.

(ඉ) අමාත්‍ය මණ්ඩලයට නිවැරදි තීන්දු තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියළුම තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දීමට වගකිවයුතු නිලධාරින් කටයුතු කළ යුතු බව.

(ඊ) ලංකා සතොස ආයතනය රාජ්‍ය සමාගමක් වන බැවින් සහ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආයතනය විසින් අනුමත කරගෙන නොමැති බැවින් සියළුම ප්‍රසම්පාදන සඳහා 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කළ යුතු බව.

(උ) සුදුසුකම් ඇති සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කරගෙන හදිසි අවස්ථාවලදී එම සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා මිලදී ගැනීම් කළ යුතු බව.

(ඌ) මුදලට අගය යන සංකල්පය ආරක්ෂා වන පරිදි ආර්ථිකමයභාවය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යන ගුණාංග රැකෙන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවිය යුතු බව.

(එ) ආයතනයට අවශ්‍ය කාර්ය මණ්ඩලය නැවත සමාලෝචනය කර ඒ අනුව පිළියෙල කරනු ලබන අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් සහ පළපුරුදු පුද්ගලයින් බඳවා ගැනීමටත් එම නිලධාරීන් ආයතනය තුළ රඳවා ගැනීමටත් කටයුතු කළ යුතු බව.

(ඒ) සියළුම නිලධාරින්ගේ රාජකාරි ලිපිගොනු භාර ගැනීම සහ භාර දීම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදු කළ යුතු බව.

(ඔ) ලංකා සතොස ආයතනය තුළ විධිමත් පරිගණක තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර එයට ලංකා සතොස ආයතනයට අයත් සියළුම අලෙවිසල් හා ගබඩා ජාලගත කළ යුතු බව.

(ඕ) සෑම වෙළඳසලකටම සහ ගබඩාවකටම විධිමත් තොග පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව.

(ක) ආයතනයේ වැදගත් තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර එමගින් තීරණ ගැනීම් සිදු කළ යුතු බව.

(ග) අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබන භාණ්ඩාගාරයේ නිලධාරින්ගෙන් වඩා හොඳ උපදේශනයන් සිදු විය යුතු බව.

(ච) අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත් කර අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් කළ යුතු බව.

(ජ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ඇ) සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 8.9.3 අනුව රු.500,000 ඉක්මවන සියළුම භාණ්ඩ හා සේවා සැපයුම්වලදී අදාල බලධාරින් විසින් අත්සන් කරනු ලබන විධිමත් ගිවිසුම්වලට එළඹිය යුතු බව.

## 15. නිගමන

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අරමුණුවල ඇතුළත්,

උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසා ගැනීම, නිසි කලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රසම්පාදන කටයුතු කිරීම;

නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට, නීතිරීතිවලට සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම;

සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම;

කඩිනමින් භාණ්ඩ හා සේවා සැපයීම;

ඇගැයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික වීම;

යන අවශ්‍යතාවයන් ඉටුවන පරිදි 2014 සහ 2015 වර්ෂවලදී පිරිවැය (CIF) රු.15,691,695,005 ක් වූ මෙ.ටො. 250,693 ක සහල් ආනයන ක්‍රියාවලිය මෙහෙයවා නොමැති බව නිගමනය කරනු ලැබේ.

(ආ) මෙම වාර්තාවේ අනාවරණය කර ඇති රු.15,157,031,018 ක් වූ අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගත යුතු අතර, ඉදිරියේදී එවැනි අලාභ ඇති නොවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කළ යුතු බවට නිගමනය කරනු ලැබේ.

(ඇ) සහල් ආනයනය කිරීමෙන් කෘෂි ආර්ථිකයට වන බලපෑම පිළිබඳව ප්‍රමාණවත් සැළකිල්ලක් නොදක්වා කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ.

(ඈ) ප්‍රසම්පාදනයේදී තීරණ ගැනීම සඳහා අදාල සමහර වැදගත් තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අමාත්‍ය මණ්ඩලයට ලබා දී නොතිබුණු අවස්ථා පැවති බව නිගමනය කරනු ලැබේ.

(ඉ) පිරිවැය රු.11,648,592,399 ක් වූ සහල් මෙ.ටො. 182,548 ක් ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකිරීම සහ නිසි අනුමැතියකින් තොරව රජයේ අරමුදල් භාවිතා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් වගකීමට බැඳෙන බවට තවදුරටත් නිගමනය කරනු ලැබේ.

(ඍ) මෙම වාර්තාව විගණකාධිපති සතු බලතල, සම්පත් සහ කාලය යන විෂය සීමා තුළ සිදු කරන ලද හෙයින් ඉන් ඔබ්බට ගොස් විගණකාධිපතිට නිගමනය කළ නොහැකි මට්ටමේ නීති විරෝධී හෝ සාපරාධී කටයුතු සිදු වී ඇත්දැයි යන්න මාගේ පරීක්ෂාවට ලක් නොකෙරුණි. එබැවින් එවැනි පරීක්ෂාවක් කළ යුතු යැයි හැඟී යන්නේ නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්හි සහාය ලබා ගැනීම සුදුසු බව නිගමනය කරනු ලැබේ.